# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ)

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

Web:www.nie.lk
Email: info@nie.lk

මුද්‍රණය හා බෙදාහැරීම: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

F-Pa

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

විද්‍යා හා තාක්ෂණ පීඨය
වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

F-Pa

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

11 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය 2016

ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

විද්‍යා හා තාක්ෂණ පීඨය
වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

F-Pa

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.
නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී පළමුවන, හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.
මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදී. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිතා කර ඇත.
ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.
තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.
මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

අතීතයේ සිටම අධ්‍යාපනය නිරන්තරයෙන් වෙනස්වීම් වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබුණි. මෑත යුගයේ මෙම වෙනස්වීම දැඩි ලෙස සීඝ්‍ර වී ඇත. ඉගෙනුම් ක්‍රමවේදවල මෙන් ම තාක්ෂණික මෙවලම් භාවිතය අතින් හා දැනුම උත්පාදනය සම්බන්ධයෙන් ද ගත වූ දශක දෙක තුළ විශාල පිබිදීමක් දක්නට ලැබුණි. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනය ද 2015ට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අප්‍රමාදව සුදුසු පියවර ගනිමින් සිටී. ගෝලීයව සිදුවන වෙනස්කම් ගැන හොඳින් අධ්‍යයනය කර දේශීය අවශ්‍යතා අනුව අනුවර්තනයට ලක්කර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ප්‍රවේශය පාදක කර ගනිමින් නව විෂයමාලාව සැලසුම් කර පාසල් පද්ධතියේ නියමුවන් ලෙස සේවය කරන ගුරු භවතුන් වන ඔබ වෙත මෙම ගුරු මාර්ගෝපදේශය පුද කරන්නේ ඉතා සතුටිනි.

මෙවැනි නව මග පෙන්වීමේ උපදේශන සංග්‍රහයක් ඔබ වෙත ලබාදෙන්නේ ඒ මගින් ඔබට වඩා හොඳ දායකත්වයක් ලබාදිය හැකිවේ ය යන විශ්වාසය නිසා ය.

මෙම උපදේශන සංග්‍රහය පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට මහඟු අත්වැලක් වනවාට කිසිම සැකයක් නැත. එසේම මෙය ද උපයෝගී කර ගනිමින් කාලීන සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් වඩාත් සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ පන්ති කාමරය හසුරුවා ගැනීමට ඔබට නිදහස ඇත.

ඔබ වෙත ලබාදෙන මෙම ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර වඩා නිර්මාණශීලි දරු පරපුරක් බිහි කර ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට ගෙන යාමට කැපවීමෙන් යුතුව කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වුයේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ගුරු භවතුන් හා සම්පත් පුද්ගලයින් රැසකගේ නොපසුබට උත්සාහය හා කැපවීම නිසා ය.

අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය උදෙසා නිම වු මෙම කාර්යය මා ඉතාමත් උසස් ලෙස අගය කරන අතර මේ සඳහා කැපවී ක්‍රියා කළ ඔබ සැමට මගේ ගෞරවාන්විත ස්තූතිය පිරි නමමි.

එම්.එෆ්.එස්.පී. ජයවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(විද්‍යා හා තාක්ෂණ පීඨය)

# අධ්‍යක්ෂකගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව සම්බන්ධයෙන් දැනට පිළිගෙන ඇති ප්‍රතිපත්තිය අනුව සෑම වසර අටකටම වරක් සමස්ත විෂයමාලාව සංශෝධනය කළ යුතුව ඇත. මෙසේ නව සංශෝධනයන් අවශ්‍ය වන්නේ දේශීය හා ගෝලීය වශයෙන් ඇති වන වෙනස්වීම් හා අභියෝගයන්ට මුහුණ දිය හැකි දරු පරපුරක් අප රටේ ද බිහිකළ යුතුය යන අර්ථවත් අපේක්ෂාව නිසා ය. ගතවූ කාලය තුළ දී ආර්ථික, දේශපාලන, සමාජයීය හා වාණිජ වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් ද විශාල වෙනසකට පත්වෙමින් පවතී. මේ පිළිබඳව අවධානය යොමුකරමින් 2015 වර්ෂයේ සිට විෂයමාලා සංශෝධනය ආරම්භ කර ඇත.

ඉහත සඳහන් තත්ත්වය ගැන සලකා 11 ශ්‍රේණිය සඳහා ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂය සම්බන්ධයෙන් ගුරු අත්පොත ලියා ඉදිරිපත් කිරීම ගැන මා අතිශයින් ම සතුටු වෙමි.

විශේෂයෙන් ම මෙම කාර්ය සපුරාලීම සඳහා කැපවීමෙන් යුතුව කටයුතු කළ ලේඛක මණ්ඩලයට හා මෙම කාර්ය ඉතාමත් සාර්ථක ලෙස නිම කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ලබා දුන් අධ්‍යක්ෂ ජනරාල්තුමාට, සහකාර අධ්‍යක්ෂ ජනරාල්තුමන්ට හා සහාය දැක්වූ අනෙකුත් සියලුම දෙනාට මගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

11 ශ්‍රේණිය සඳහා වූ මෙම ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය ගුරු අත්පොත දරුවන්ට වඩාත් සාර්ථක ලෙස ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සඳහා විෂය අධ්‍යක්ෂවරුන්ට, ගුරු උපදේශකවරුන්ට හා ගුරුභවතුන්ට ද මහත් අත්වැලක් වන බව මම තරයේ ම විශ්වාස කරමි.

ආචාර්ය ඒ. සිවනේසරාජා
අධ්‍යක්ෂ,
වාණිජ දෙපාර්තමේන්තුව,
විද්‍යා හා තාක්ෂණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

## ගුරු අත්පොත පරිශීලනය සඳහා උපදෙස්

වර්ෂ 2015 සිට ආරම්භ වූ විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සඳහා වූ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන විෂය නිර්දේශය පදනම්ව 11 ශ්‍රේණිය සඳහා මෙම ගුරු අත්පොත සකස් කර තිබේ.

සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙන ආකාරයට ඔබගේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීම අපේක්ෂා කරමින් ඒ සඳහා ඔබට මගපෙන්වීමක් වශයෙන් මෙහි ආදර්ශ ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇත.

මෙම ගුරු අත්පොත සකස් කර ඇත්තේ පන්ති කාමරය තුළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතු අනුපිළිවෙළට ම ය. විෂය නිර්දේශයේ ඇති සෑම නිපුණතා මට්ටමක් සඳහා ම **ඉගෙනුම් ඵල** ඉදිරිපත් කර ඇත. එම ඉගෙනුම් ඵලවලට හා අදාළ නිපුණතා මට්ටමට සියලු ම සිසුන් ළඟා වන ආකාරයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් ඔබ විසින් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂිත ය. ඒ සඳහා ඔබට කරන මගපෙන්වීමක් ලෙස එක් එක් නිපුණතා මට්ටම් යටතේ **ඉගෙනුම් – ඉගැන්වීම් ක්‍රියාවලිය** ඉදිරිපත් කර ඇත. එම උපදෙස් එලෙස ම අනුගමනය කිරීම අනිවාර්ය නොකෙරෙන අතර සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙන ආකාරයේ වෙනත් සුදුසුයැයි හැඟෙන ශිෂ්‍ය කේන්ද්‍රීය වූ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට නිර්මාණශීලී ඔබට පූර්ණ නිදහස ඇත.

එසේ ම සෑම නිපුණතා මට්ටමක් යටතේම " **විෂය අන්තර්ගතය සංක්ෂිප්තව**" මෙම ගුරු අත්පොතේ ඉදිරිපත් කර ඇත. එසේම සෑම නිපුණතා මට්ටමක් සඳහා ම ඔබට මග පෙන්වන " **සංකල්ප ඇතුළත් සිතියමක්**" (**Concept Map**) ද ඉදිරිපත් කර ඇත. එක් එක් නිපුණතා මට්ටම යටතේ, ඉදිරිපත් කරන විෂය කරුණුවල සම්බන්ධතාව ඉන් මනාව ඔබට හඳුනාගත හැකි වේ. ඒ මගින් එය ඔබ පන්ති කාමරයේ දී ක්‍රියාකාරකම් තුළින් අනාවරණය කර ගත යුතු හා සිසුන්ට සටහනක් ලෙස ලබාදිය යුතු විෂය කරුණුවලට මගපෙන්වීමක් ද ලබාදේ.

පී.එච්. කුසුමාවතී
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
වාණිජ දෙපාර්තමේන්තුව.

උපදේශකත්වය හා අනුමැතිය : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය සම්බන්ධීකරණය : ආචාර්ය ඒ. සිවනේසරාජා (අධ්‍යක්ෂ)
පී.එච්. කුසුමාවතී (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
එස්.කේ. ප්‍රභාහරන් (කථිකාචාර්ය)

විෂයමාලා කමිටුව : අභ්‍යන්තර
පී.එච්. කුසුමාවතී (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
එස්.කේ. ප්‍රභාහරන් (කථිකාචාර්ය)
එස්. ආර්. රත්නජීව (සහකාර කථිකාචාර්ය)

බාහිර
සිරිමා නානායක්කාර (ගුරු උපදේශක)
කලාප අධ්‍යාපන කාර්යාලය, ඇල්පිටිය.
වසන්ත රණතුංග (සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ)
කලාප අධ්‍යාපන කාර්යාලය, දෙහිඅත්තකණ්ඩිය.
සී.එල්.එම්. නවාස් (ගුරු උපදේශක)
කලාප අධ්‍යාපන කාර්යාලය, ඉබ්බාගමුව
එම්.එච්.එම්. බුහාරි (විශ්‍රාමික ගුරු උපදේශක)

විෂය සංස්කරණය : මහාචාර්ය සමන්ති සේනාරත්න, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ආචාර්ය කුමාර උලුවත්ත (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), වයඹ විශ්ව විද්‍යාලය
ඉසුරු නදීෂ මානවඩු (කථිකාචාර්ය, වරලත් ගණකාධිකාරී)
මොරටුව විශ්ව විද්‍යාලය.

භාෂා සංස්කරණය : එස්.ඒ.ඩී. ගුණපාල (කථිකාචාර්ය, අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව)
ජාතික අධ්‍යාපන ආයතනය.

සෝදුපත් : ජේ. විජයවික්‍රම - අධ්‍යාපන අධ්‍යක්ෂිකා (විශ්‍රාමික)
දීපාල් සී පෙරේරා - ගුරු සේවය
බල/කැල/ශාන්ත ආනා බාලිකා මහ විදුහල,වත්තල

පරිගණක අක්ෂර සංයෝජනය : තේජා සේපාලිකා මැණිකේ - ජාතික අධ්‍යාපන ආයතනය

| පටුන | පිටු අංකය |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | ii |
| අධ්‍යක්ෂකගේ පණිවුඩය | iii |
| ගුරු අත්පොත පරිශීලනය කිරීමට උපදෙස් | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi-ix |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | 01-10 |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 11-102 |

## හැඳින්වීම

මෙම විෂය නිර්දේශය වර්ෂ 2015 දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. එමගින් ශිෂ්‍යයාගේ ඉදිරි පෞද්ගලික දිවි පැවැත්මට අවශ්‍ය මඟපෙන්වීමක් සිදු කිරීමට ඉවහල්වන ව්‍යාපාර දැනුම හා කුසලතා වර්ධනය, පාරිභෝගික දැනුම වර්ධනය, ගනුදෙනු සටහන් කිරීම, ව්‍යාපාර ප්‍රතිඵල ඇගයීම, තොරතුරු තාක්ෂණය, ඉතිරිකිරීම හා ආයෝජනයට නැඹුරු කිරීම, ව්‍යාපාර කළමනාකරණය ආදී අංශ පිළිබඳ ව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමට බලාපොරොත්තු වේ. එමෙන් ම මෙම විෂයය ඉගෙනීමෙන් ව්‍යවසායකයන්, කළමනාකරුවන් සහ වෙනත් වෘත්තිකයන් බිහිකිරීමට මූලික පදනමක් ගොඩනැගෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ තුළින් රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීමට ද අපේක්ෂා කෙරේ.

එමෙන් ම ශිෂ්‍ය කේන්ද්‍රීය නිපුණතා පාදක ක්‍රියාකාරකම් ප්‍රමුඛ ව ශිෂ්‍යයාගේ සමෝධානික පෞරුෂය ගොඩනැගීමට ශික්ෂණ විද්‍යාත්මක එළෙඹුමෙන් බලාපොරොත්තු වේ. ශික්ෂණ විද්‍යාත්මක එළඹුම හා විෂය අන්තර්ගතය වෙනස් කිරීමෙන් වන සංකලනයෙන්, ඉගෙනීමෙන් ප්‍රතිඵල ලබා ජීවිතයේ අවසානය දක්වා ම ඵල ලබන, සමාජයට බරක් නොවන, සමාජ වගකීමෙන් යුතුව කටයුතු කරන, වෙනස්වන ලෝකයේ තත්ත්වයන්ට අනුකලනය විය හැකි පුරවැසියන් බිහිකිරීමට මෙම විෂයමාලාව ඉවහල් වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

## ජාතික පොදු අරමුණු

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව (2003 දෙසැම්බර්)

## පොදු නිපුණතා සමූහ

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණය ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(ii) **පෞරුෂත්ව වර්ධනය අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ ඵලදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම.

## විෂය අරමුණු

(1) ව්‍යාපාර ආශ්‍රිත වෘත්තීයකට නැඹුරුවීම හෝ තමාගේම ව්‍යවසායක් ආරම්භ කිරීමේ හැකියාව ඇති කිරීමට.
(2) ව්‍යාපාර ගණුදෙනු වාර්තා කිරීමට, පිටපත් කිරීමට හා ව්‍යාපාරයක අවසාන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට.
(3) මනා කළමනාකාරිත්වයක් සහ අවබෝධයකින් යුතුව ව්‍යාපාරයක් පවත්වා ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීමට.
(4) සමාජ වගකීම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරන ව්‍යාපාරිකයකු/ පාරිභෝගිකයකු බවට පත් කිරීමට.
(5) ඉලෙක්ට්‍රෝනික ගත වාණිජ්‍ය හා ගිණුම්කරණය පිළිබඳ මූලික හැකියා ලැබීමට.

## කාලච්ඡේද වෙන් කිරීම

යෝජිත විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අනුව අ.පො.ස. (සා.පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය සඳහා සතියකට කාලච්ඡේද තුන බැගින් වර්ෂයට කාලච්ඡේද 90 ක් වෙන් කර ඇත. ඒ අනුව විෂය නිර්දේශයට නියමිත වර්ෂ දෙක සඳහා කාලච්ඡේද 180 ක් වෙන් කර තිබේ. විෂය නිර්දේශයේ ඒ ඒ නිපුණතා සඳහා ද, එම නිපුණතා තුළ නිපුණතා මට්ටම් සඳහා ද කාලය වෙන් වශයෙන් දක්වා ඇත. නිපුණතාවලට වෙන් කරන ලද කාලය නිපුණතා මට්ටම්වලට වෙන් කරන ලද කාලයට වඩා වැඩි ය. මින් අදහස් කරන්නේ අමතර කාලය අභ්‍යාස හා ඇගයීම් ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීමයි.

## තක්සේරුව හා ඇගයීම

### පාසල් මට්ටම

පාසල් මට්ටම සඳහා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය පොදුවේ අනුගමනය කරන තක්සේරු කිරීමේ හා ඇගයීමේ විවිධ ශිල්පීය ක්‍රම මෙම විෂය සඳහා ද අනුගනය කිරීම යෝග්‍ය වේ.

### ජාතික මට්ටම

11 වන ශ්‍රේණිය අවසානයේ පැවැත්වෙන ජාතික මට්ටමේ අගයීම් සඳහා දෙනු ලබන ලිඛිත පරීක්ෂණය අදාළ වේ.

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක වේ )**


**වාණිජ දෙපාර්තමේන්තුව**
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

Web:www.nie.lk
Email: info@nie.lk


F-Pa

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන - 11 ශ්‍රේණිය - විෂය නිර්දේශයේ අන්තර්ගතය

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6. උපකාරක සේවාවල සහාය ලබමින් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව පදනම් දැනුම ගොඩනගා ගනියි | | | | 20 |
| | 6.1 ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා බැංකු සේවාවල දායකත්වය විමසයි. | • බැංකු කටයුතුවල අවශ්‍යතාව.<br>• බැංකු ගිණුම් වර්ග<br>• ඉතිරිකිරීමේ ගිණුම<br>• ජංගම ගිණුම<br>• ස්ථාවර තැන්පතු<br>• විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා.<br>• ණයපත් නිකුතුව.<br>• හර කාඩ්පත් නිකුතුව<br>• ටෙලර් කාඩ්පත් නිකුතුව<br>• විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවේ වැදගත්කම<br>• ක්ෂණික බව<br>• සියලු තොරතුරු ඉලෙක්ට්‍රෝනික ගත වීම<br>• කාර්‍යක්ෂමතාවය<br>• විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවේ ඇති සීමාවන්<br>• තාක්ෂණික ගැටළු<br>• නව ආකාරයේ වංචා සිදුවීම<br>• වංචා වැළැක්වීම සඳහා නව ඉලෙක්ට්‍රෝනික ක්‍රමවල අවශ්‍යතාව | • බැංකු සේවාවල අවශ්‍යතාව දක්වමින් බැංකු ගිණුම් වර්ග කරයි.<br>• ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර දක්වයි.<br>• ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරන ආකාරය දක්වයි.<br>• විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන් හා ඒවායේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන්හි ඇති සීමාවන් දක්වයි. | 03 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි හා චෙක්පත් පිළිබඳ ව විමසයි. | • ජංගම ගිණුමක වාසි<br>• චෙක්පත් මගින් ගණුදෙනු කිරීම<br>• අයිරා පහසුකම් ලබා ගැනීම<br>• ප්‍රේෂණ ක්‍රියාත්මක කිරීම<br>• ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම<br>• ආරක්ෂාව<br>• බැංකු ප්‍රකාශයක් ලැබීම<br>• චෙක්පතට සම්බන්ධ ප්‍රධාන පාර්ශවයන්<br>• අණකරු<br>• අණලදු<br>• ආදායකයා<br>• චෙක්පත් ලිවීම<br>• චෙක්පත් රේඛනය<br>• චෙක්පත් පිටසන් කිරීම | • ජංගම ගිණුමක වාසි පෙළගස්වයි.<br>• චෙක්පතක් සම්බන්ධ පාර්ශව නම් කරයි.<br>• ජංගම ගිණුමක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර දක්වයි.<br>• ආදර්ශ චෙක්පතක් සම්පූර්ණ කරයි.<br>• චෙක්පතක් බැංකුගත කිරීම සඳහා අවශ්‍ය පියවර දක්වයි. | 04 |
| | 6.3 රක්ෂණයේ වැදගත්කම විමසමින් අවදානම් කළමනාකරණය සඳහා පදනම සකසා ගනියි. | • රක්ෂණ සංකල්පය<br>• ජීවිත රක්ෂණය<br>• දේපල රක්ෂණය<br>• රක්ෂණ මූලධර්ම<br>• රක්ෂණ හිමිකම/රක්ෂ්‍ය හිමිකම<br>• උපරිම විශ්වාසය/සද්භාවය<br>• හානිපූර්ණය<br>(අ.පො.ස.(සා.පෙළ) මට්ටමේ දී රක්ෂණ/මූලධර්ම සරලව සැකෙවින් පැහැදිලි කිරීම සෑහේ.) | • රක්ෂණ සංකල්පය පැහැදිලි කරයි.<br>• ජීවිත රක්ෂණ හා දේපළ රක්ෂණය අතර වෙනස දක්වයි.<br>• රක්ෂණ මූලධර්ම සරලව පැහැදිලි කරයි. | 03 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.4 සන්නිවේදනයේ මූලික පදනම විමසමින් භාවිතයට අවශ්‍ය පෙර සූදානම සකසා ගනියි. | • සන්නිවේදන සංකල්පය.<br>• ආයතනයක සන්නිවේදන සිදුවන ආකාර<br>  • අභ්‍යන්තර<br>  • බාහිර<br>• සන්නිවේදන මාධ්‍ය<br>  • වාචික<br>  • ලිඛිත<br>  • විද්‍යුත්<br>  • සංඥා හා සලකුණු<br>• සන්නිවේදන මාධ්‍යයන්ට අදාළ ක්‍රම<br>• සන්නිවේදන ක්‍රියාවලිය හා මූලිකාංග<br>  • පණිවුඩය යවන්නා<br>  • පණිවුඩය<br>  • මාධ්‍ය<br>  • පණිවුඩය ලබන්නා<br>  • ප්‍රතිචාර<br>  • ප්‍රතිපෝෂණය<br>• සුදුසු සන්නිවේදන ක්‍රමයක් ව්‍යාපාර විසින් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු. | • සන්නිවේදන සංකල්පය පැහැදිලි කරයි.<br>• ආයතනයක සන්නිවේදනය සිදුවන ආකාර දක්වයි.<br>• සන්නිවේදන මාධ්‍ය හා ක්‍රම දක්වයි.<br>• සන්නිවේදන මූලිකාංග දක්වයි.<br>• සන්නිවේදන ක්‍රියාවලිය පෙළගස්වයි.<br>• සුදුසු සන්නිවේදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු පෙළගස්වයි. | 03 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 ප්‍රවාහන සේවාවන් යොදාගෙන ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව කිරිමට අවශ්‍ය මුලික හැකියා ලබයි. | ● ප්‍රවාහන සංකල්පය<br>● ප්‍රවාහනයේ මුලිකාංග<br>  ● මාධ්‍ය<br>  ● මාර්ගය<br>  ● බලය<br>  ● පර්යන්තය<br>● සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේ දී ව්‍යාපාර විසින් සලකා බලන සාධක<br>  ● පිරිවැය<br>  ● ධාරිතාව<br>  ● සුලභත්වය<br>  ● වේගය<br>  ● ආරක්ෂාව<br>● ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරිම සඳහා ප්‍රවාහනය දායක වන ආකාර<br>● විවිධ ප්‍රවාහන ක්ෂේත්‍ර හා එහි වාසි/අවාසි<br>  ● මහාමාර්ග<br>  ● දුම්රිය මාර්ග<br>  ● ගුවන් මාර්ග<br>  ● ජල මාර්ග | ● ප්‍රවාහන සංකල්පය පැහැදිලි කරයි.<br>● ප්‍රවාහන මුලිකාංග නම් කරයි.<br>● සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක දක්වයි.<br>● විවිධ ප්‍රවාහන ක්ෂේත්‍රවල වාසි අවාසි දක්වයි. | 03 |
| | 6.6 දේශීය වෙළඳාමේ හා විදේශීය වෙළඳාමේ සැබෑ පාර්ශවකරුවකු වීමට අවශ්‍ය මුලික හැකියා ප්‍රදර්ශනය කරයි. | ● දේශීය වෙළඳාම<br>  ● සිල්ලර වෙළඳාම<br>    ● ලක්ෂණ/ස්වභාවය<br>  ● තොග වෙළඳාම<br>    ● ලක්ෂණ/ස්වභාවය<br>  ● සිල්ලර හා තොග වෙළඳාමේ ඇති වෙනස<br>● විදේශීය වෙළඳාම | ● දේශීය වෙළඳාම පැහැදිලි කරයි.<br>● සිල්ලර වෙළඳාම පැහැදිලි කරයි.<br>● සිල්ලර වෙළඳාමේ වැදගත්කම දක්වයි.<br>● තොග වෙළඳාම පැහැදිලි කරයි.<br>● තොග වෙළඳාමේ වැදගත්කම දක්වයි.<br>● සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම අතර වෙනස දක්වයි.<br>● විදේශීය වෙළඳාම පැහැදිලි කරයි.<br>● විදේශීය වෙළඳාම සඳහා නිදසුන් දක්වයි. | 04 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7. ව්‍යාපාර කළමනාකරණයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | | | | 06 |
| | 7.1 කළමනාකරණයේ මූලික හැකියා ලබයි. | • "කළමනාකරණ" සංකල්පය<br>• කළමනාකරණ කාර්යයන්<br>• සැලසුම්කරණය<br>• සංවිධානකරණය<br>• මෙහෙයවීම<br>• පාලනය | • කළමනාකරණ සංකල්පය සරලව පැහැදිලි කරයි.<br>• කළමනාකරණ කාර්යයන් හතර නම් කරයි. | 03 |
| | 7.2 අලෙවිකරණයේ මූලික පදනම සොයා බලයි. | • "අලෙවිකරණ" සංකල්පය<br>• අලෙවිකරණ මිශ්‍රය (4P)<br>• නිෂ්පාදිතය<br>• මිල කිරීම<br>• ස්ථානය<br>• ප්‍රවර්ධනය | • අලෙවිකරණ සංකල්පය සරලව පැහැදිලි කරයි.<br>• අලෙවිකරණ මිශ්‍රයට අයත් සංරචක නම් කරයි. | 03 |
| 8. ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. | | | | **54** |
| | 8.1 ව්‍යාපාරයක වෙළෙඳ ගිණුම් පිළියෙල කරයි. | • මූල්‍ය ප්‍රකාශන<br>• වෙළෙඳ ගිණුම<br>• ආරම්භක තොගය<br>• ගැණුම්<br>• ගෙන ඒමේ කුලී<br>• අවසාන තොගය<br>• විකුණුම්<br>• විකුණුම් පිරිවැය<br>• දළ ලාභය/අලාභය | • මූල්‍ය ප්‍රකාශන නම් කරයි<br>• විකුණුම් පිරිවැය ගණනය කරයි<br>• වෙළෙඳ ගිණුම පිළියෙල කර දළ ලාභය හෝ අලාභය ගණනය කරයි | 05 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 ව්‍යාපාරයක ලාභාලාභ ගිණුම පිළියෙල කරයි. | • ලාභාලාභ ගිණුම<br>• විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් (බෙදා හැරීමේ වියදම්)<br>• ආයතන හා පරිපාලන වියදම් (පරිපාලන වියදම්)<br>• මූල්‍ය හා වෙනත් වියදම්<br>• දළ ලාභය /අලාභය වාර්තා කිරීම<br>• වෙනත් ආදායම්<br>• ශුද්ධ ලාභය/අලාභය | • ලාභාලාභ ගිණුම යන්න පැහැදිලි කරයි.<br>• බෙදාහැරීමේ වියදම් වාර්තා කරයි<br>• පරිපාලන වියදම් වාර්තා කරයි<br>• මූල්‍ය හා වෙනත් වියදම් වාර්තා කරයි<br>• දළ ලාභයට වෙනත් ආදායම් එකතු කරයි<br>• ශුද්ධ ලාභය/අලාභය ගණනය කරයි.<br>• ශුද්ධ ලාභය/අලාභය ප්‍රාග්ධනයට මාරු කරන ආකාරය දක්වයි.<br>• වෙළඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කරයි (ආදායම් ප්‍රකාශනය) | 10 |
| | 8.3 ගිණුම් කාලච්ඡේදයට අදාල ගෙවිය යුතු වියදම් හා ලැබිය යුතු ආදායම් ගලපයි | • උපචිත පදනම<br>• ගෙවිය යුතු වියදම්<br>• ලැබිය යුතු ආදායම් | • උපචිත පදනම සරලව පැහැදිලි කරයි.<br>• ගෙවිය යුතු වියදම් ගලපයි.<br>• ලැබිය යුතු ආදායම් ගලපයි. | 05 |
| | 8.4 කාලච්ඡේදයට අදාල බොල්ණය ගලපයි. | • බොල් ණය<br>• බොල් ණය කපා හැරීම<br>• බොල් ණය වියදම<br>• බොල් ණය නිසා වත්කම් අඩුවීම | • බොල් ණය හඳුන්වයි<br>• බොල් ණය ගලපයි.<br>• බොල් ණය ගැලපීමට අදාල ද්විත්ව සටහන ඉදිරිපත් කරයි. | 03 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.5 කාලච්ඡේදයට අදාලව ජංගම නොවන වත්කම් ක්ෂය කරයි. | • ගොඩනැගිලි, යන්ත්‍ර, මෝටර් රථ, ලී බඩු වැනි වත්කම් ක්ෂය (දේපල පිරියත හා උපකරණ)<br>• වත්කම් ක්ෂය කිරීමට හේතු<br>• සරල මාර්ග ක්ෂය ක්‍රමය<br>• ක්ෂය සඳහා ගිණුම් තැබීම<br>  • ක්ෂය වෙන් කිරීමේ ගිණුම<br><br>(අ.පො.ස.(සා.පෙළ) මට්ටමට ජංගම නොවන වත්කම් ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමයට ගිණුම් වාර්තා කිරීම සෑහේ) | • ජංගම නොවන වත්කම් ක්ෂය වීමට හේතු දක්වයි.<br>• සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුව වත්කම් ක්ෂය කරයි.<br>• ක්ෂය වෙන් කිරීමේ ගිණුමක් ඇසුරින් ක්ෂය සඳහා ගිණුම් තබයි.<br>• ක්ෂය වීම ලාභය හා වත්කම කෙරෙහි වන බලපෑම පැහැදිලි කරයි. | 05 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.6 ව්‍යාපාරයේ ලාභදායිත්වය හා මුල්‍ය තත්ත්වය අනාවරණය කරයි | • ශේෂ පත්‍රය/මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය<br>• හිමිකම්<br>• ජංගම වගකීම්<br>• ජංගම නොවන වගකීම්<br>• ජංගම වත්කම්<br>• ජංගම නොවන වත්කම්<br>• වෙළෙඳ හා ලාභාලාභ ගිණුම (ආදායම් ප්‍රකාශනය) සහ ශේෂපත්‍රය. | • ශේෂ පත්‍රය තුළ ප්‍රාග්ධනය සටහන් කරයි.<br>• ශේෂ පත්‍ර අයිතම ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කර දක්වයි.<br>• ශේෂ පත්‍රය පිළියෙල කරයි.<br>• ගැලපීම් සහිත මුල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි | 07 |
| | 8.7 ලාභය අරමුණු කර නොගත් සංවිධානයක මුල්‍ය ප්‍රකාශන දක්වමින් ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරයි. | • ලාභ අරමුණු කර නොගත් සංවිධාන<br>• ලාභ අරමුණු කර නොගත් සංවිධානයක අරමුණු<br>• ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මුල්‍ය ප්‍රකාශන<br>• ලැබීම් හා ගෙවීම් ගිණුම<br>• ආදායම් හා වියදම් ගිණුම | • ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් යන්න හඳුන්වයි<br>• ලාභ අරමුණු කර නොගත් සංවිධානයක අරමුණු දක්වයි.<br>• ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මුල්‍ය ප්‍රකාශන නම් කරයි.<br>• ලැබීම් ගෙවීම් ගිණුම පිළියෙල කිරීමේ අරමුණ දක්වයි.<br>• ලැබීම් ගෙවීම් ගිණුම පිළියෙල කරයි | 05 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.8 ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කරයි. | • ආදායම් හා වියදම් ගිණුම<br>• අතිරික්තය හෝ ඌනතාව | • ආදායම් හා වියදම් ගිණුම පැහැදිලි කරයි.<br>• ආදායම් හා වියදම් ගිණුමක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව දක්වයි.<br>• ආදායම් හා වියදම් ගිණුමක් පිළියෙල කරයි.<br>• අතිරික්තය හෝ ඌනතාව ගණනය කරයි. | 04 |
| | 8.9 නිෂ්පාදන පිරිවැය ලේඛනයක් සකස් කරයි. | • නිෂ්පාදන පිරිවැය<br>  • ප්‍රාථමික පිරිවැය<br>    • ඍජු ද්‍රව්‍ය.<br>    • ඍජු ශ්‍රමය.<br>    • ඍජු වෙනත් පිරිවැය<br>  • නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය<br>    • වක්‍ර ද්‍රව්‍ය<br>    • වක්‍ර ශ්‍රමය<br>    • වක්‍ර වෙනත් පිරිවැය<br>• නිෂ්පාදන ඒකකයක පිරිවැය<br>• ඒකකයක ලාභාන්තිකය<br>• ඒකකයක විකුණුම් මිල<br>• පැතුරුම්පතක් භාවිතයෙන් (Excel spread sheet) හෝ වෙනත් ක්‍රමයක් භාවිතයෙන් නිෂ්පාදන පිරිවැය හා ඒකකයක විකුණුම් මිල ගණනය කර පෙන්වීම. | • නිෂ්පාදන පිරිවැය පැහැදිලි කරයි.<br>• නිෂ්පාදන පිරිවැය මූලිකාංග නම් කර, පැහැදිලි කරයි<br>• ප්‍රාථමික පිරිවැය ගණනය කරයි.<br>• නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ගණනය කරයි.<br>• මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරයි.<br>• නිෂ්පාදන ඒකකයක පිරිවැය ගණනය කරයි.<br>• ඒකකයක විකුණුම් මිල තීරණය කරයි<br>• පැතුරුම්පත් හෝ සුදුසු ක්‍රමයක් භාවිතයෙන් නිෂ්පාදන පිරිවැය හා ඒකකයක විකුණුම් මිල ගණනය කරන ආකාරය සරලව ඉදිරිපත් කරයි. | 10 |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 ආයෝජනය පිළිබඳ විමර්ශනය කරමින් යෝග්‍ය තීරණවලට එළැඹේ. | | | | 10 |
| | 9.1 ආයෝජනයේ වැදගත්කම විමර්ශනය කරයි. | • ආයෝජනය හැඳින්වීම<br>• විවිධ ආයෝජන මාර්ග<br>• ඉතිරිකිරීමේ ගිණුම හා ස්ථාවර තැන්පතු<br>• දේපළ මිලදී ගැනීම<br>• කොටස් වෙළඳපොළ ආයෝජනය<br>• සුදුසු ආයෝජන මාර්ගයක් තේරීම | • ආයෝජනයේ වැදගත්කම පැහැදිලි කරයි<br>• විවිධ ආයෝජන මාර්ග දක්වයි<br>• සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී මූලික අවධානය යොමු කළ යුතු සාධක දක්වයි. | 05 |
| | 9.2 කොටස් වෙළෙඳපොළ ආයෝජනයේ වැදගත්කම විමර්ශනය කරයි. | • කොටස් වෙළෙඳපොළ ආයෝජනය හැඳින්වීම<br>• කොටස් වෙළෙඳපොළ ආයෝජන මාර්ග<br>• සාමාන්‍ය කොටස් මිලදී ගැනීම<br>• භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම<br>• ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම් සභාවේ වැදගත්කම | • කොටස් වෙළෙඳපොළ ආයෝජනයේ වැදගත්කම පෙන්වයි.<br>• සාමාන්‍ය කොටස් ආයෝජනයේ වැදගත්කම පෙන්වයි<br>• භාණ්ඩාගාර බිල්පත් ආයෝජනයේ වැදගත්කම පෙන්වයි. | 05 |
| | | | | 90 |

**නිපුණතාව 6** : **උපකාරක සේවාවල සහාය ලබමින් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව පදනම් දැනුම ගොඩනගා ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා බැංකු සේවාවල දායකත්වය විමසයි.


**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගැනීමට හැකිවේ.

- බැංකු සේවාවල අවශ්‍යතාව දක්වමින් බැංකු ගිණුම් වර්ග කිරීමට.
- ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර දැක්වීමට.
- ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරන ආකාරය දැක්වීමට.
- විද්‍යුත් මුදල් හා ඒවායේ වැදගත්කම පැහැදිලි කිරීමට.
- විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන්හි ඇති සීමාවන් දැක්වීමට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



සාමාන්‍යයෙන් වාණිජ බැංකුවක් විසින් පහත සඳහන් ගිණුම් වර්ග පවත්වාගෙන යයි.

- ඉතිරිකිරීමේ ගිණුම්
- ජංගම ගිණුම්
- ස්ථාවර තැන්පතු

බැංකු විසින් වර්තමානයේ දී විද්‍යුත් හා සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් තම ගණුදෙනුකරුවන්ට උපරිම සේවාවන් ලබා දෙනු ලැබේ. ඒ සඳහා පහත සඳහන් සේවාවන් ඉතාමත් ප්‍රචලිත ව බැංකු විසින් ක්‍රියාත්මක කෙරේ.

**ණය කාඩ්පත්** (Credit Card) වාණිජ බැංකුවක් විසින් ණය පදනමක් මත නිකුත් කරනු ලබන මෙම කාඩ්පත් මගින් වාණිජ බැංකු අනුමත කර ඇති ආයතනයකින් ගණුදෙනුකරුට භාණ්ඩ හා සේවා ලබා ගත හැකි ක්‍රමයකි. එමෙන්ම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) මගින් යම් කිසි සිමාවක් දක්වා මුදල් ද ලබා ගත හැකිය. මේ සඳහා ගණුදෙනු කරුට බැංකු ගිණුමක් තිබීම අවශ්‍ය නොවේ. නිදඃවීසා ණයකාඩ්, මාස්ටර් ණය කාඩ්.

**හර කාඩ්පත** (Debit Card) බැංකු ගිණුමේ ඇති මුදල් පදනම් කරගෙන බැංකුවක් විසින් තම ගණුදෙනුකරුවන්ට නිකුත් කරන කාඩ්පත හරපතක් ලෙස හඳුන්වනු ලැබේ. මෙහිදී අනුමත ආයතනයකින් ගිණුමේ ඇති මුදල් ශේෂය දක්වා භාණ්ඩ හා සේවා මිලදී ගත හැකි අතර ATM මගින් මුදල ද ලබාගත හැකියි. භාණ්ඩ මිලදී ගැනීමේ දී. අදාළ wdh ; k f h a(විකුණුම්කරුගේ) භාණ්ඩ මිලදී ගැනීමේ දී විකුණුම්කරුගේ ගිණුමට, කාඩ්පත් හිමියාගේ ගිණුමෙන් මුදල් මාරු වේ. නිදඃ Boc වීසා හර කාඩ්පත්

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත්
(ATM Card) සාමාන්‍ය ඉතිරිකිරීමේ පාස්පොතකින් ගණුදෙනුකරුවන්ට ලබාගත හැකි සේවාවන්ට සමාන සේවාවක් ලබා ගත හැකි වන පරිදි වාණිජ බැංකු හා වෙනත් මුල්‍ය ආයතන විසින් නිකුත් කරන කාඩ්පතක් වේ. මෙය හර කාඩ්පතක් ලෙස ද භාවිත කිරීමේ පහසුකම ද බැංකුව මගින් සපයා ගත හැකියි. මෙහිදී සියලු ම සේවාවන් සිදු කරනු ලබන්නේ පරිගණකය ආශ්‍රයෙන් ක්‍රියාත්මක කෙරෙන යන්ත්‍රයක් වන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM) මගිනි.

විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන් මගින් කාර්යක්‍ෂම වුත්, ක්‍රමානුකූල වුත් සේවාවක් ලබා දිය හැකි ය. එසේ ම විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන්හි යම් යම් සීමාවන්ද දක්නට ලැබේ. එනම් තාක්ෂණික ගැටළු මතුවීම, රහස් අංකය අමතක වීම / වංචාකාරී සිදුවීම් ඇති වීමට පවත්නා ඉඩකඩ වැඩි වීම වැනි දෑය. මේ නිසා සන්නිවේදන හා තාක්ෂණ ක්‍රම භාවිතයෙන් ඇතිවන අපහසුතා වැළැක්වීමට උපක්‍රම ද සොයා ගැනීමේ අවශ්‍යතාව මතුවී තිබේ.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්** -

- මෙම නිපුණතා මට්ටමට අදාළ ව ප්‍රථම පාඩමට පිවිසීමේ දී බැංකු සේවාවක අවශ්‍යතාව පිළිබඳ සිසුන් දැනුවත් කර, වාණිජ බැංකුවක පවත්නා ගිණුම් වර්ග පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- විද්‍යුත් මුදල් සම්බන්ධව කෙටි හැඳින්වීමක් කරන්න.
- ඉතුරුම් ගිණුම්, හා ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට අවශ්‍යවන ආකෘති පත්‍ර කට්ටලය බැගින් සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයා බැංකුව ලෙසත්, සිසුන් ගිණුම් ආරම්භ කරන්නන් ලෙසත් සලකා ආකෘති පත්‍ර සම්පූර්ණ කරමින් ගිණුම් ආරම්භ කරන ආකාරය ප්‍රායෝගිකව සිදු කරන්න.

- පිරවූ ආකෘති පත්‍ර ඇසුරින් පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පාස්පොතක් බැංකුව මගින් ලබා දෙන බව. (පාස්පොත් නොමැති ගිණුම් වර්ගද ඇත )
  - මැන්ඩේට් පත්‍රයක් සම්පූර්ණ කළ යුතු බව.
  - හැඳුනුම්පත අවශ්‍ය බව.

**ඇමුණුම 6.1.1. ලබාදෙන්න.** එහිදී 11 ශ්‍රේණියේ පෙළපොතේ ඇතුළත් විෂය කරුණු අධ්‍යයනය කරමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.

**ඇමුණුම 6.1. 1.**

පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | නිර්ණායක | ඉතුරුම් තැන්පතු | ස්ථාවර තැන්පතු |
|---|---|---|---|
| 1. | පොළී ප්‍රතිශතය | --------------- | --------------- |
| 2. | ගිණුම පිළිබඳව බැංකුව ලබා දෙන ලේඛනය | --------------- | -------------- |
| 3. | මුදල් තැන්පත් කිරීම | --------------- | --------------- |
| 4. | මුදල් ආපසු ගැනීම | --------------- | -------------- |
| 5. | වෙනත් පහසුකම් | --------------- | --------------- |

පහත සඳහන් කාඩ්පත්වල ලක්ෂණ හා සේවාවන් ලැයිස්තුගත කරන්න.

| **කාඩ්පත** | **ලක්ෂණ** | **සේවාවන්** |
|---|---|---|
| හර කාඩ්පත් | ------------<br>------------<br>----------- | ------------<br>------------<br>----------- |
| ණය කාඩ්පත් | -----------<br>------------<br>------------<br>------------<br>----------- | ------------<br>------------<br>------------<br>------------<br>----------- |
| ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පත් | -----------<br>------------<br>------------<br>------------ | ------------<br>------------<br>------------<br>------------ |

**ගුණාත්මක යෙදවුම් -**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළපොතේ අදාල පාඩම.

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක**

- ඉතිරිකිරීමේ ගිණුමක් ආරම්භ කිරීමේ පියවර දැක්වීම.
- ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරන ආකාරය දැක්වීම.
- ඉතිරිකිරීමේ ගිණුමක් හා ස්ථාවර තැන්පතුවක් අතර වෙනස දැක්වීම.
- විද්‍යුත් මුදල් ආශ්‍රිතව බැංකුවක් මගින් සපයන සේවා තුනක් විස්තර කිරීම
- විද්‍යුත් මුදල්වල සීමාවන් දෙකක් ඉදිරිපත් කිරීම.

**නිපුණතාව 6** : **උපකාරක සේවාවල සහාය ලබමින් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව පදනම් දැනුම ගොඩ නගා ගනියි.**

**නිපුණතා මට්ටම 6.2** : ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි හා චෙක්පත් පිළිබඳව විමසයි.


**කාලච්ඡේද** : 04 යි

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගැනීමට හැකිවේ.

- ජංගම ගිණුමක වාසි පෙළගැස්වීමට.
- චෙක්පත් පිළිබඳ පාර්ශ්ව නම් කිරීමට.
- ජංගම ගිණුමක් ආරම්භ කිරිම සඳහා අවශ්‍ය පියවර දැක්වීමට.
- ආදර්ශ චෙක්පතක් සම්පූර්ණ කිරිමට.
- චෙක්පතක් බැංකුගත කිරීම සඳහා අවශ්‍ය පියවර දැක්වීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

## සංකල්ප සිතියම (Concept Map)



**ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි** -

* චෙක්පත් මගින් ගණුදෙනු කිරීම, අතැති මුදල් පරිහරණය කරනවාට වඩා ආරක්ෂාකාරී ය, පහසුය, කාලය ඉතිරිවේ.

* විවිධ ආදායම් ලැබීම් හා වෙනත් ලැබීම් සෘජුව ම ජංගම ගිණුමට බැර කළ හැකිය. මේවා **සෘජු ප්‍රේෂණ ලෙස** හැඳින්වේ.

* ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු ණය වාරික හා රක්ෂණ වාරික වැනි දෑ ජංගම ගිණුම හරහා ගෙවීම් කරන ලෙස, ජංගම ගිණුම් හිමියන්ට බැංකුවෙන් ඉල්ලීමක් කළ හැකිය. මේවා **ස්ථාවර නියෝග** ලෙස හැඳින්වේ.

* ජංගම ගිණුමේ මුදල් ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීමට හා මුදල් ලබාගැනීමට බැංකුව ලබාදෙන අවසරය **බැංකු අයිරාවක්** ලෙස හඳුන්වයි.

* නිශ්චිත කාලයක් අවසානයේ දී ජංගම ගිණුම මගින් කරන ලද ගණුදෙනුවල සාරාංශයක් බැංකුව විසින් ජංගම ගිණුම් හිමියන්ට එවන අතර, එය **බැංකු ගිණුම් විස්තරය (බැංකු ප්‍රකාශය)** ලෙස හැඳින්වේ. බැංකු ගිණුම් විස්තරයක් ලැබීමෙන් ජංගම ගිණුම් හිමියාට තම ගිණුමේ ඇති මුදල් කළමනාකරණය කර ගැනිමට පහසු වේ.

**ජංගම ගිණුම**
චෙක්පත් මගින් ගණුදෙනු කිරිම සඳහා වාණිජ බැංකුවක ආරම්භ කරන ගිණුම, ජංගම ගිණුමක් වන අතර, ඒ සඳහා වාණිජ බැංකුව විසින් ගිණුම්හිමියාට චෙක්පොතක් ලබා දේ.

**බැංකු ගිණුම් විස්තරය : (බැංකු ප්‍රකාශය)**
නිශ්චිත කාලච්ඡේදයක් අවසානයේ දී (සාමාන්‍යයෙන් මසකට) බැංකුව විසින් ජංගම ගිණුම් හිමියාට, තම ගිණුම සම්බන්ධයෙන් එවන ලද ගණුදෙනු සාරාංශය බැංකු ප්‍රකාශනය නම් වේ.

**චෙක්පත**
"ජංගම ගිණුම් හිමියකු විසින් යම් නිශ්චිත මුදලක්, නිශ්චිත පුද්ගලයෙකුට හෝ රැගෙන එන්නාට ගෙවන ලෙස වාණිජ බැංකුවකට කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පත්" වේ.

**චෙක්පතට සම්බන්ධ ප්‍රධාන පාර්ශව**

| | | |
|---|---|---|
| **අණකරු** | - | ජංගම ගිණුම් හිමියා. |
| **අණලදු** | - | අදාල වාණිජ බැංකුව |
| **ආදායකයා** | - | චෙක්පතේ මුහුණත නම සඳහන් පුද්ගලයා |

**චෙක්පත් ලිවීම**

චෙක්පත් ලිවීමේ දී අදාල කොන්දේසි අනුගමනය නොකළහොත් අදාළ චෙක්පත ගෙවීමට සුදුසු චෙක්පතක් නොවනු ඇත. (බැංකු විසින් අගරු කරනු ලබයි.)

**එම කොන්දේසි නම්** -


* බැංකුවේ තබා ඇති ආදර්ශ අත්සන, චෙක්පතෙහි ද තැබීම.
* ඉලක්කමෙන් සහ අකුරෙන් ලියන වටිනාකම සමාන වීම.
* පැහැදිලි අකුරෙන් ලිවීම/මුද්‍රණය කිරීම.
* නිවැරදිව දිනය යෙදීම.
* චෙක්පත විකෘති නොකිරීම, සංශෝධන ඇත්නම් ඒවා පැහැදිලිව සටහන් කර සම්පූර්ණ අත්සනක් මගින් සනාථ කිරීම.

**චෙක්පත් රේඛනය** - චෙක්පතෙහි මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම රේඛනය ලෙස හැඳින්වේ. ඇතැම් චෙක්පත්වල රේඛනය මුද්‍රිතව ඇත. රේඛනය කරන ලද චෙක්පතකට සෘජුවම බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත නොහැකිය. එනම් චෙක්පත ගිණුමක තැන්පත් කළ යුතුය.

චෙක්පතේ ආරක්ෂාව සඳහා චෙක්පතක් රේඛනය කළ හැකියි. රේඛනය සිදු කරන ප්‍රධාන ආකාර දෙකක් වේ. එනම්

**සාමාන්‍ය රේඛනය** - චෙක්පතෙහි මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය වේ. එය පහත සඳහන් ආකාරයට චෙක්පතේ මුහුණතේ දැක්විය හැකිය.

නිදඃ




**විශේෂ රේඛනය** - සමාන්තර රේඛා සහිතව හෝ රහිතව චෙක්පතෙහි මුහුණත වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම විශේෂ රේඛනය වේ. එය පහත ආකාරයට කළ හැකිය.

නිදඃ




**චෙක්පත් පිටසත් කිරීම** :

චෙක්පතේ මුහුණත සඳහන් නම ඒ අකාරයටම චෙක්පත පිටුපස අදාළ කොටසේ ලිවීම චෙක්පත් පිටසන් කිරීමයි. එය වෙනත් අයකුට පැවරීමේදී හෝ චෙක්පත බැංකු ගිණුමක තැන්පත් කිරීමේදී හෝ චෙක්පත පිටසන් කල යුතුය.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්** -

* මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩමට පිවිසීමේ දී පහත සඳහන් ප්‍රශ්න සිසුන්ට යොමු කරමින් කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පුද්ගලයකුට බැංකුවක ආරම්භ කළ හැකි ගිණුම් වර්ග මොනවාද ?
  - ව්‍යාපාරිකයින්ට වඩාත් සුදුසු ගිණුම් වර්ගය කුමක්ද ?
  - එම ගිණුම් වර්ගය මගින් ව්‍යාපාරිකයින්ට ඇති වාසි මොනවාද ?
  - එම ගිණුමෙන් ගනුදෙනු කරන්නේ කෙසේද ?

* 11 ශ්‍රේණියේ පෙළපොතේ පාඩමට අදාළ විෂය කරුණු හොඳින් අධ්‍යයනය කිරීමට යොමු කරවන්න.

* එහිදී පහත සඳහන් විෂය කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලෙස දැනුවත් කරන්න.

- * චෙක්පතේ සඳහන් දිනය
- * ආදායකයා
- * වටිනාකම
- * අණලදු
- * අණකරු ගේ අත්සන
- * චෙක්පතේ අංකය
- * බැංකුවේ අංකය
- * බැංකු ශාඛාවේ අංකය
- * ජංගම ගිණුම් අංකය
- * රේඛනය (සාමාන්‍ය, විශේෂ)
- * චුම්භක තීන්ත අක්ෂර තීරුව
- * පිළිපත
- * පිටසන් කිරීම

* විශාල කරන ලද පිළිපතක් සහිත ආදර්ශ චෙක්පතක් නිර්මාණය කරගෙන විත් හුණු පුවරුවේ ප්‍රදර්ශනය කරන්න. 6.2.1 සිද්ධිය ද හුණු පුවරුවේ ප්‍රදර්ශනය කර, එම සිද්ධිය සියලු ම ළමයින්ට පෙනෙන සේ ඉදිරිපත් කරන්න.

* ඇමුණුම 6.2.2 හි ඇතුළත් සිසු උපදෙස් පත්‍රිකාව සිසුන්ට ලබා දී එය අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

* පහත උපදෙස් අනුගමනය කරමින් සිසුන් කාර්යයෙහි යොදවන්න.

- * උපදෙස් පත්‍රිකාවේ සඳහන් ප්‍රශ්න එක් අයෙකුට එක් ප්‍රශ්නය බැගින් ඉදිරිපත් කර අදාළ පිළිතුර හුණු පුවරුවේ ඇති චෙක්පතෙහි ලිවීමට (සම්පූර්ණ කිරීමට) යොමු කරන්න.
  ශිෂ්‍ය සංඛ්‍යාව අනුව සුදුසු පරිදි චෙක්පත පිරවීමට සිසුන් යොදා ගන්න.

* සිසුන් විසින් සියලු ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරිපත් කිරීමෙන් පසු පහත කරුණු සම්බන්ධයෙන් සමාලෝචනයක් කරන්න.

- * චෙක්පතක මුලිකාංග
- * චෙක්පතකට සම්බන්ධ පාර්ශවයන්
- * චෙක්පත් ලිවීම
- * චෙක්පත් පිටසන් කිරිම.
- * චෙක්පත් රේඛනය කිරිම.

**ඇමුණුම 6.2.1**

අමල් පෙරේරා ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකි. ඔහු 2014.05.30 දින මිලදී ගන්නා ලද රු. 50,000 ක් වටිනා භාණ්ඩ තොගයක් සඳහා පී. කමල් ශාන්තට අංක 200125 දරණ ලංකා බැංකු චෙක්පතින් ගෙවීම සඳහා තම ලිපිකරු වු නාමල් ගජනායකට පවරන ලදී. තවද කමල් ශාන්ත, තමන්ට ගෙවිය යුතු මුදලක් සඳහා මෙම චෙක්පත වෙනත් අයෙකුට පැවරීමට අවශ්‍ය වී ඇත.

ලංකා බැංකු අංකය : 7010 ශාඛා අංකය : 055

**ඇමුණුම 6.2.2**

**සිසු උපදෙස් -**

- හුණු පුවරුවේ ඇති සිද්ධිය හොඳින් කියවන්න.
- එම සිද්ධිය පදනම් කරගෙන පහත ප්‍රශ්න හොඳින් අධ්‍යයනය කරන්න.
    - ආදායකයාගේ නම ලියන්න.
    - මුදල ඉලක්කමෙන් ලියන්න.
    - මුදල අකුරෙන් ලියන්න.
    - අණකරුගේ අත්සන යොදන්න.
    - චුම්භක අක්ෂර තීරුව ලකුණු කරන්න.
    - චෙක්පත නිකුත් කළ දිනය යොදන්න.
    - බැංකුවේ අංකය හඳුනාගෙන ලකුණු කරන්න.
    - බැංකු ශාඛාවේ අංකය ලකුණු කරන්න.
    - චෙක්පතේ අංකය ලකුණු කරන්න.
    - පිළිපත සම්පූර්ණ කරන්න.
    - අණලද්දා කවුරුදැයි හඳුනාගෙන ලකුණු කරන්න.
    - මෙම චෙක්පතට සාමාන්‍ය රේඛනයක් යොදන්න.
    - එය විශේෂ රේඛනයක් බවට පත් කරන්න.
    - මෙම චෙක්පත වෙන පුද්ගලයකුට පැවරීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා පිටසන යොදන්න.

- ඔබට ලැබෙන ප්‍රශ්නයට අදාළ පිළිතුර හුණු පුවරුවේ ඇති චෙක්පතේ අදාල නියමිත ස්ථානයේ ලියන්න/පුරවන්න.

- අනික් සිසුන්ට ලැබෙන ප්‍රශ්නයට පිළිතුරු පුරවන /ලියන ආකාරය නිවැරදි දැයි නිරීක්ෂණය කරන්න.
  පිළිතුර වැරදි නම් ඔබ විසින් එය නිවැරදි කරන ආකාරය ඉදිරිපත් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණියේ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළපොතේ අදාල පාඩම

**තක්සේරු හා ඇගැයීම් නිර්ණායක**

- ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ගිණුම් හිමියන්ට ලබාගත හැකි වාසි පහක් ලියා දැක්වීම.
- චෙක්පතක් බැංකුගත කිරීමේ පියවර දැක්වීම.
- දෙන ලද ආදර්ශ චෙක්පතට අදාල පහත සඳහන් තොරතුරු පහක් ආදර්ශනය කිරීම.
    - සුදුසු දිනයක් යෙදීම.
    - ආදායකයාගේ නම ලිවීම (කල්පිත නමක් )
    - උපකල්පනය කරන ලද වටිනාකමක් අකුරෙන් හා ඉලක්කමෙන් පැහැදිලිව ලිවීම.
    - අණකරු අත්සන් යෙදීම ( උපකල්පනය කරන ලද අත්සනක්)
    - චුම්භක අක්ෂර තීරුව ලකුණු කිරිම.
    - අණලද්දාගේ නම ලිවීම.
    - බැංකුවේ අංකය ලකුණු කිරිම හෝ දෙන ලද අංකය ලිවීම.
    - පිළිපත සම්පූර්ණ කිරීම.
    - සාමාන්‍ය හෝ විශේෂ රේඛනයක් කිරීම.
    - පිටසන යෙදීම.

**නිපුණතාව 06** : **උපකාරක සේවාවල සහාය ලබමින් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ පදනම් දැනුම ගොඩනගා ගනියි.**

**නිපුණතා මට්ටම 6.3** : රක්ෂණයේ වැදගත්කම විමසමින් අවදානම් කළමනාකරණය සඳහා පදනම සකසා ගනියි.


**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකිවේ.

- රක්ෂණය යන සංකල්පය පැහැදිලි කිරීමට.
- පුද්ගල රක්ෂණය හා දේපල රක්ෂණය අතර වෙනස දැක්වීමට.
- රක්ෂණ මූලධර්ම පැහැදිලි කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



**රක්ෂණය** - අවදානම් ඒකරාශී කර එක් පාර්ශවයකට සිදුවන හානිය/පාඩුව සාමූහිකව බෙදාගැනීම රක්ෂණයයි.

**පුද්ගල ආරක්ෂණය** - ජීවිතවලට සිදුවිය හැකි අවදානම සම්බන්ධයෙන් වන රක්ෂණයයි.

**දේපල රක්ෂණ** - දේපලවලට සිදුවිය හැකි අවදානම් රක්ෂණය, දේපල රක්ෂණය වේ.

**රක්ෂණ මූලධර්ම**

රක්ෂණ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් මූලධර්ම බලපානු ලැබේ.

**රක්ෂණ හිමිකම** - ජීවිත හෝ දේපලක් රක්ෂණය කිරීමට ඇති නීත්‍යානුකූල අයිතිය. මෙහිදී දේපල හෝ ජීවිතය පැවැත්මෙන් ආර්ථික වාසියකුත් එය විනාශ වීමෙන් ආර්ථික අවාසියකුත් සිදුවිය යුතු බව.

**උපරිම විශ්වාසය** - රක්ෂණයට සම්බන්ධ දෙපාර්ශවය විසින් රක්ෂණ ගිවිසුමට අදාල වැදගත් යැයි හැඟෙන සියළු තොරතුරු නොසඟවා ඉදිරිපත් කළ යුතු බව.

**හානිපූර්ණය** - රක්ෂණ දේපලවලට හානි සිදුවූ අවස්ථාවක දී හානිය යථා තත්වයට පත්කිරීමට. සරිලන වන්දියක් පමණක් ගෙවිය යුතු බව.
(මෙම මූලධර්මය ජීවිත රක්ෂණය සඳහා අදාළ නොවේ.)

**(සැ.යු. අ.පො.ස.(සා.පෙළ) සඳහා මෙම මූලධර්ම තුන පමණක් සාකච්ඡා කෙරේ.)**

**රක්ෂණයේ අවශ්‍යතාව** - අනපේක්ෂිත සිදුවීම්වලින් ජීවිත සහ දේපලවලට සිදුවන හානි සඳහා මූල්‍යමය ආවරණයක් ලැබීම.

| දේපල රක්ෂණය | ජීවිත රක්ෂණය/ජීවිත ආරක්ෂණය |
|---|---|
| * රක්ෂණ ඔප්පුවේ වටිනාකම දේපල වටිනාකම අනුව තීරණය වේ.<br>* රක්ෂණ ඔප්පුව පැවරිය හැකිය.<br>* හානියක් සිදුවුවහොත් සිදුවූ හානියේ ප්‍රමාණයට අනුව වන්දි ගෙවයි.<br>* හානි පූර්ණ මූලධර්මය බලපායි.<br>* වෙනත් ප්‍රතිලාභ හිමිනොවේ.<br>* කෙටිකාලීනය. | * රක්ෂණ ඔප්පුවේ වටිනාකම පුද්ගල කැමැත්ත හා ගෙවීමේ හැකියාව මත තීරණය වේ<br>* රක්ෂණ ඔප්පුව පැවරිය නොහැක.<br>* හානියක් සිදුවූ විට වන්දි ද, හානියක් සිදු නොවූ විට ගෙවන ලද මුදල් ද ආපසු ලබාගතහැකිය.<br>* හානි පූර්ණ මූලධර්මය බල නොපායි<br>* වෙනත් ප්‍රතිලාභ හිමිය.(ප්‍රසාද දීමනා)<br>* දිගුකාලීනය. |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩමට පිවිසීමේ දී **අනතුරකට පත්වූ වාහන සහිත දර්ශනයක් සහ ව්‍යාපාරයක් ගිනි ගන්නා දර්ශනයක්** පන්තියට ඉදිරිපත් කරන්න.
- එහිදී ව්‍යාපාරවලට සිදුවන මෙවැනි අවදානම්වලට මුහුණදීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අනතුරුව පහත කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.
    - රක්ෂණය
    - රක්ෂණ මූලධර්ම
    - දේපල රක්ෂණය.
    - පුද්ගල රක්ෂණය.

- 6.3.1 හි සඳහන් සැණපත් සිසුන්ට ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යොදවන්න.
- සැණපතේ ඇතුළත් ප්‍රකාශය අනුව එය හොඳින් කියවීමට සිසුන් යොමු කරන්න.
- ඉන්පසු පහත ප්‍රශ්න සිසුන්ට ඉදිරිපත් කරන්න.

    - ඔබට ලැබුණු සැණපතේ ඇතුළත් ප්‍රකාශය පුද්ගල අවදානමක් ද දේපල අවදානමක් ද ? යන්න සඳහන් කරන්න.
    - 11 ශ්‍රේණිය පෙළපොතේ අදාල පාඩමේ ඇතුළත් විෂය කරුණු ඇසුරින් ඉහත ඔබ විසින් වර්ග කළ පුද්ගල සහ දේපල රක්ෂණයට අදාල රක්ෂණ මුලධර්ම නම් කරන්න.
    - ජීවිත හා දේපල රක්ෂණයේ ඇති වෙනස්කම් පහත ආකාරයෙන් සැසඳීමට ලක් කරන්න.

| පුද්ගල රක්ෂණය | දේපල රක්ෂණය |
|---|---|
| 1 | 1 |
| 2 | 2 |
| 3 | 3 |
| 4 | 4 |
| 5 | 5 |

**ඇමුණුම 6.3.1**

සැණපත්

- හදිසි ගින්නකින් නගරයේ කඩකාමර විශාල ප්‍රමාණයකට හානි.
- දුම්රිය දෙකක් ගැටීමෙන් ජීවිත දේපලවලට බරපතල හානි.

- අධික වර්ෂාව හේතුවෙන් වගාබිම් වලට හා නිවාසවලට බරපතල හානි.

- අකුණුසැර වැදීම හේතුවෙන් පුද්ගලයින් දෙදෙනෙකුට ජීවිත හානිවීම.

**ගුණාත්මක යෙදවුම්**
- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොතේ අදාල පාඩම .
- විවිධ රක්ෂණ සමාගම් මගින් නිකුත් කරන ලද තොරතුරු පත්‍රිකා.

**තක්සේරුකරණය හා ඇගැයීම් නිර්ණායක**
- රක්ෂණය සංකල්පය පැහැදිලි කිරිම.
- රක්ෂණය වර්ග පැහැදිලි කිරීම.
- රක්ෂණ මුලධර්ම නම් කිරීම.

**නිපුණතාව 06** : **උපකාරක සේවාවල සහාය ලබමින් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ පදනම් දැනුම ගොඩ නගා ගනියි.**

**නිපුණතා මට්ටම 6.4** : සන්නිවේදනයේ මූලික පදනම විමසමින් භාවිතයට අවශ්‍ය පෙර සූදානම සකසා ගනියි.


**කාලච්ඡේද** - **03 යි.**

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකිවේ.

- සන්නිවේදන සංකල්පය පැහැදිලි කිරිමට.
- සන්නිවේදනය සිදුවන ආකාර නම් කිරිමට.
- සන්නිවේදන මූලිකාංග දැක්වීමට.
- සන්නිවේදන මාධ්‍ය හා ක්‍රම දැක්වීමට.
- සන්නිවේදන ක්‍රියාවලිය පෙළගැස්වීමට.
- සන්නිවේදන ක්‍රමයක් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු දැක්වීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

## සංකල්ප සිතියම (Concept Map)



**සන්නිවේදනය** - පණිවුඩ, තොරතුරු, අදහස් දෙපාර්ශවයක් අතර යම් මාධ්‍යයක් ඔස්සේ හුවමාරු කර ගැනීමයි.

**සන්නිවේදනය සිදුවන ආකාර** - **අභ්‍යන්තර සන්නිවේදනය**
ආයතනය තුළ විවිධ මාධ්‍ය භාවිත කරමින් පණිවුඩ, තොරතුරු හා අදහස් හුවමාරු කර ගැනීම.
- **බාහිර සන්නිවේදනය**
ආයතනයක් වෙනත් බාහිර පුද්ගලයකු හෝ ආයතනයක් සමග පණිවුඩ, තොරතුරු හා අදහස් හුවමාරු කර ගැනීම.

| **සන්නිවේදන මාධ්‍ය.** | | **සන්නිවේදන ක්‍රම** |
|---|---|---|
| වාචික | - | රැස්වීම්, සාකච්ඡා |
| ලිඛිත | - | ලිපි, දැන්වීම්, චක්‍රලේඛ |
| විද්‍යුත් | - | රූපවාහිනී, ගුවන්විදුලිය, ශබ්දවාහිනි, දුරකථනය අන්තර්ජාලය, |
| සංඥා සලකුණු | - | මාර්ග සංඥා, හැසිරවීමේ සංඥා, ඇසුරුම් සංකේත. |

**සන්නිවේදන ක්‍රියාවලියට ඇතුළත් මූලිකාංග.**
- පණිවුඩය යවන්නා
- පණිවුඩය
- මාධ්‍යය
- පණිවුඩය ලබන්නා
- ප්‍රතිචාර දැක්වීම
- ප්‍රතිපෝෂණය

**සන්නිවේදන ක්‍රමයක් තෝරා ගැනීමේ දි සලකා බලන සාධක.**
- ගැළපෙන බව / සුදුසු බව
- වේගවත් බව.
- පිරිවැය
- පැහැදිලි බව
- යොදා ගැනීමේ පහසුව
- තේරුම්ගත හැකි බව.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**
- මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩමට පිවිසීමේ දී පාසල තුළ පණිවුඩ/අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාවිත කරන ක්‍රම සිසුන්ගෙන් විමසා ඒවා බාහිර හා අභ්‍යන්තර ලෙස වර්ග කළ හැකි බවත්, එමෙන්ම ලිඛිත හා වාචික, විද්‍යුත්, සංඥා ලෙස ද වර්ග කළ හැකි බවත් පැහැදිලි කරන්න.
- ඉන්පසු සන්නිවේදනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
- සන්නිවේදනය ක්‍රියාවලියක් බව පැහැදිලි කරන්න.
- ඇමුණුම 6.4.1 හි ඇතුළත් ආදර්ශ වගුවක් සිසුන්ට හෝ කණ්ඩායම්වලට ලබා දී 11 ශ්‍රේණියේ පෙළපොතෙහි පාඩම අධ්‍යයනය කිරීමට යොමු කරවන්න.
- පිළිතුරු සැපයිය යුතු වගුවෙහි ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට යොමු කරවන්න.
- සිසුන් ලබාදෙන පිළිතුරු පදනම් කර ගනිමින් පහත සඳහන් විෂය කරුණු පැහැදිලි කර දෙන්න.

- සන්නිවේදනය හැඳින්වීම
- සන්නිවේදන සිදුවන ආකාර හා සන්නිවේදන මාධ්‍ය නම් කිරීම.
- සන්නිවේදන මූලිකාංග, සන්නිවේදන ක්‍රියාවලිය ඇසුරින් මතුකර දීම.
- සන්නිවේදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැළකිය යුතු කරුණු.

---

ඇමුණුම 6.4.1

**පිළිතුරු සැපයිය යුතු වගුව**

(1) ඔබ දන්නා සන්නිවේදන ක්‍රමයන් හැකි තරම් ලියන්න.

(2) එම සන්නිවේදන ක්‍රම ව්‍යාපාරයක් ඇසුරින් සලකා පහත ආකාර දෙකට වෙන්කර දක්වන්න.

| අභ්‍යන්තර | බාහිර |
|---|---|
| | |

(3) පළමු වගුවේ ඇතුළත් සන්නිවේදන ක්‍රම, සන්නිවේදන මාධ්‍යවලට වෙන්කරන්න.


| ලිඛිත | වාචික | විද්‍යුත් | සංඥා සලකුණු |
|---|---|---|---|
| | | | |

(4) ව්‍යාපාරයක් ලෙස සන්නිවේදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බලන කරුණු සඳහන් කරන්න.

(5) පහත සඳහන් සිද්ධිය හොඳින් කියවන්න.

2015.03.14 දින පෙ.ව. 10.30 ට රැස්වීම් ශාලාවේ දී ශාඛා කළමනාකරුවන්ගේ රැස්වීමක් පැවැත්වෙන බවත්, එයට සහභාගීවීම අත්‍යවශ්‍ය බවත්, සමාගමක කළමනාකරු විසින් විද්‍යුත් තැපෑලෙන් (E.mail ) ශාඛා කළමනාකරුවන් වෙත දන්වා ඇත. ඒ අනුව එම රැස්වීමට සහභාගී වන බව ශාඛා කළමනාකරුවන් විසින් විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් සමාගම් කළමනාකරුට දන්වා ඇත.

- ඉහත සිද්ධිය මගින් සන්නිවේදන ක්‍රියාවලියේ ඇතුළත් මූලිකාංගවලට අදාල නිදසුන්, දී ඇති එක් එක් කොටුව තුළ ලියන්න.




**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොතේ අදාල පාඩම .

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක.**

- පහත දැක්වෙන සන්නිවේදන ක්‍රම ඇතුළත් වගුව අධ්‍යයන කර එම සන්නිවේදන ක්‍රම අයත්වන සන්නිවේදන මාධ්‍ය හා සන්නිවේදනය සිදුවන ආකාරවලට අදාළ කොටුව තුළ (✓) ලකුණ යෙදීම.

| | | මාධ්‍ය | | | | සිදුවන ආකාර | |
|---|---|---|---|---|---|---|---|
| | | ලිඛිත | වාචික | විද්‍යුත් | සංකේත හා සංඥා | අභ්‍යන්තර | බාහිර |
| 01. | ලිපි. | | | | | | |
| 02. | අන්තර්ජාලය | | | | | | |
| 03. | රැස්වීම | | | | | | |
| 04. | රූපවාහිනිය | | | | | | |
| 05. | බැනරය | | | | | | |
| 06. | ගුවන්විදුලිය | | | | | | |
| 07. | විද්‍යුත් තැපැල | | | | | | |
| 08. | සාකච්ඡා | | | | | | |
| 09. | ෆැක්ස් | | | | | | |
| 10. | ශබ්දවාහිනී | | | | | | |
| 11. | අත් පත්‍රිකා | | | | | | |
| 12. | දුරකථනය | | | | | | |
| 13. | දැන්වීම් පුවරුව | | | | | | |
| 14. | චක්‍රලේඛ | | | | | | |
| 15. | පෝස්ටර් | | | | | | |
| 16. | Face Book | | | | | | |
| 17. | වැඩමුළු | | | | | | |
| 18. | ඩිජිටල් පුවරුව | | | | | | |
| 19. | සම්මන්ත්‍රණය | | | | | | |
| 20 | සීනුව | | | | | | |
| 21 | CCTV | | | | | | |
| 22. | විද්‍යුත් සීනුව | | | | | | |


- සන්නිවේදන ක්‍රියාවලිය නිදසුනක් ඇසුරින් ඉදිරිපත් කිරීම.
- සන්නිවේදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 5 ක් දැක්වීම.

| | | |
|---|---|---|
| **නිපුණතාව 6** | **:** | **උපකාරක සේවාවල සහාය ලබමින් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව පදනම් දැනුම ගොඩනගා ගනියි.** |
| **නිපුණතා මට්ටම 6.5** | **:** | ප්‍රවාහන සේවාවන් යොදාගෙන ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව කිරීමට අවශ්‍ය මූලික හැකියා ලබයි. |
| **කාලච්ඡේද** | **:** | **03 යි.** |
| **ඉගෙනුම්ඵල** | **:** | මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගැනීමට හැකිවේ. |

- ප්‍රවාහන සංකල්පය පැහැදිලි කිරීමට.
- ප්‍රවාහන මූලිකාංග දැක්වීමට
- සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක දැක්වීමට.
- විවිධ ප්‍රවාහන **ක්ෂේත්‍රවල** වාසි අවාසි සාකච්ඡා කිරීමට.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

## සංකල්ප සිතියම (Concept Map)



ප්‍රවාහනය - කිසියම් ස්ථානයක සිට තවත් ස්ථානයකට භාණ්ඩ හෝ මගින් ගෙන යාම ප්‍රවාහනය වේ.

ප්‍රවාහන මූලිකාංග - ප්‍රවාහන ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා බලපාන සාධක ප්‍රවාහන මූලිකාංග වේ.

- **මාර්ගය** - ප්‍රවාහනයට භාවිත කරන මංමාවත්
- **මාධ්‍ය** - විවිධ ප්‍රවාහන මාර්ගවල ප්‍රවාහනයට යොදවන වාහන.
- **බලය** - ප්‍රවාහන මාධ්‍ය භාවිත කිරීමට අවශ්‍ය ශක්තිය.
- **පර්යන්තය** - ප්‍රවාහන මාධ්‍ය (විවිධ වාහන) හැසිරවීමට භාවිත කරන ස්ථාන.

සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක

- පිරිවැය
- ධාරිතාව
- සුලභත්වය
- වේගය
- ආරක්ෂාව

**විවිධ ප්‍රවාහන මාර්ගවල ඇති වාසි අවාසි**

| **ප්‍රවාහන මාර්ගය** | **වාසි** | **අවාසි** |
|---|---|---|
| මහාමාර්ගය | • ගමනාන්තය දක්වා යොදාගත හැකි වීම<br>• ඕනෑම වේලාවක යොදාගත හැකිවීම. | • මාර්ග තදබදය ඇතිවීම.<br>• මාර්ග අනතුරු සිදුවීම.<br>• පරිසර දූෂණයට බලපෑම. |
| දුම්රිය මාර්ග | • භාණ්ඩ හා මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම.<br>• මගී සුවපහසුව තිබීම.<br>• දුර ගමන් සඳහා විශේෂ සේවාවක් තිබීම.<br>• පිරිවැය අඩුවීම. | • ඇතැම්විට ගමනාන්තය දක්වා යොදාගත නොහැකි වීම.<br>• නියමිත කාල සටහනකට අනුව ධාවනය කිරීම නිසා මගීන්ට අවශ්‍ය වේලාවට යොදා ගත නොහැකි වීම |
| ජල මාර්ග | • එකවර භාණ්ඩ හා මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම.<br>• ගුවන් ප්‍රවාහනයට වඩා ප්‍රවාහන ගාස්තු අඩු වීම. (පිරිවැය අඩුවීම)<br>• ජාත්‍යන්තර වෙළඳාම සඳහා පිටිවහලක් වීම.<br>• බරින් වැඩි ද්‍රව්‍ය ප්‍රවාහනය කළ හැකි වීම. | • භාණ්ඩ හා මගී ප්‍රවාහනයට දින ගණනාවක් ගත වීම.<br>• සෑම විටම යොදාගත නොහැකිවීම (සාගර, ගංගා, ඇළ මාර්ග නොමැති රටවල් හා ප්‍රදේශවලට යොදා ගත නොහැකි වීම) |
| ගුවන් මාර්ග | • වේගවත් බව.<br>• මගී සුවපහසුව වැඩිවීම.<br>• ජාත්‍යන්තර වෙළඳාම සඳහා පිටිවහලක් වීම. | • පිරිවැය අධිකවීම.<br>• අනතුරකදී විනාශය වැඩි වීම.<br>• බරින් අධික ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම අපහසු වීම. |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- අප සැම දෙනා පාසලට ලගාවන ආකාරය පිළිබඳ විමසමින් ප්‍රවාහන මූලිකාංග මතුකර දක්වන්න.

- දී ඇති ඇමුණුම 6.5.1 හි ඇතුළත් පින්තූර හතර කණ්ඩායම් හතරකට ලබා දී ඒවා හොඳින් අධ්‍යයනය කිරිමට ඉඩ සලස්වන්න.

  ඇමුණුම 6.5.1 හි ඇතුළත් පින්තූරවලින් ඔබට ලැබෙන පින්තූරයට අදාල වගුවෙහි (1), (2), (3), හා (4) යන ස්ථානවල ප්‍රවාහන මූලිකාංග ලියා වඩාත් ගැලපෙන නිදසුන් පහත සඳහන් වගුවෙන් තෝරා සටහන් කරන්න.

ගුවන් යානය, හෙලිකොප්ටරය, බෝට්ටු, මරදාන දුම්රිය ස්ථානය, ඩීසල්, කොළඹ - බදුල්ල දුම්රිය මාර්ගය, විදුලි දුම්රිය, නැව්, විදුලිබලය, කටුනායක - දිල්ලි ගුවන් මාර්ගය, ගල් අඟුරු, කොළඹ මධ්‍යම බස් නැවතුම්පල, දුම්රිය, හම්බන්තොට වරාය, කඩුවෙල - මාතර අධිවේගී මාර්ගය, පෙට්‍රල්, කටුනායක ගුවන් තොටුපල, කොළඹ - ත්‍රිකුණාමලය මුහුදු මාර්ගය, බස්රථ, මෝටර් බයිසිකලය.

**ගුණාත්මක යෙදවුම් .**
11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොත


**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක.**
- ප්‍රවාහන සංකල්පය පැහැදිලි කිරිම.
- ප්‍රවාහන මූලිකාංග දැක්වීම.
- සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක දැක්වීම.
- විවිධ ප්‍රවාහන **ක්ෂේත්‍රවල** වාසි අවාසි සාකච්ඡා කිරිම.

පින්තූර A ඇමුණුම 6.5.1




| පින්තූරයට අදාල ප්‍රවාහන මූලිකාංග | නිදසුන් |
| --- | --- |
| 1 ------------- | |
| 2 -------------- | |
| 3 -------------- | |
| 4 -------------- | |

පින්තූර B




| පින්තූරයට අදාල ප්‍රවාහන මූලිකාංග | නිදසුන් |
|---|---|
| 1 ------------- | |
| 2 -------------- | |
| 3 -------------- | |
| 4 -------------- | |

පින්තූරය C



| පින්තූරයට අදාල ප්‍රවාහන මූලිකාංග | නිදසුන් |
| --- | --- |
| 1 ------------- | |
| 2 -------------- | |
| 3 -------------- | |
| 4 -------------- | |

පින්තූරය D



| පින්තූරයට අදාල ප්‍රවාහන මූලිකාංග | නිදසුන් |
|---|---|
| 1 ------------- | |
| 2 ------------- | |
| 3 ------------- | |
| 4 ------------- | |

**නිපුණතාව 6** : **උපකාරක සේවාවල සහාය ලබමින් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව පදනම් දැනුම ගොඩනගා ගනියි.**

**නිපුණතා මට්ටම 6.6:** දේශීය වෙළඳාමේ හා විදේශීය වෙළෙඳාමේ සැබෑ පාර්ශවකරුවකු වීමට අවශ්‍ය මූලික හැකියා ප්‍රදර්ශනය කරයි.


**කාලච්ඡේද** : **04 යි.**

**ඉගෙනුම්ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම්ඵල ලඟා කර ගැනීමට හැකිවේ.

- දේශිය වෙළඳාම පැහැදිලි කිරිමට.
- සිල්ලර වෙළඳාම පැහැදිලි කිරිමට.
- සිල්ලර වෙළඳාමේ වැදගත්කම දැක්වීමට.
- තොග වෙළඳාම පැහැදිලි කිරීමට.
- තොග වෙළඳාමේ වැදගත්කම දැක්වීමට.
- සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම අතර වෙනස දැක්වීමට.
- විදේශීය වෙළඳාම පැහැදිලි කිරිමට.
- විදේශිය වෙළඳාම සඳහා නිදසුන් ඉදිරිපත් කිරිමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



**දේශීය වෙළඳාම**

රටක් ඇතුළත සිදුවන වෙළඳ කටයුතු දේශීය වෙළඳාමයි.

**සිල්ලර වෙළඳාම** : අවසාන පරිභෝජනය සඳහා විකිණීම.

ලක්ෂණ -
- අවසාන පාරිභෝජනය සඳහා කරන විකිණීම.
- අවසාන පාරිභෝජනය සඳහා මිලදී ගනියි.
- කුඩා ප්‍රමාණයෙන් අවශ්‍ය අවස්ථාවල දී පාරිභෝගික අවශ්‍යතා සැපිරීම.
- පාරිභෝගිකයාට පහසුවෙන් මිලට ගත හැකි වීම.
- වෙළඳපල පාරිභෝගිකයාට සමීප වීම.
- භාණ්ඩ වර්ග රාශියක් ඉදිරිපත් කිරීම.

**වැදගත්කම** - පාරිභෝගිකයාට අවශ්‍ය දෛනික කටයුතු සපුරාලීම.

**තොග වෙළඳාම** - නැවත විකිණීමේ අරමුණ සඳහා විකිණීම.

**තොග වෙළඳාමේ ලක්ෂණ**
- නැවත විකිණීම සඳහා මිලදී ගනියි.
- විශාල ප්‍රමාණයෙන් මිලට ගැනීම හා විකිණීම.
- සාපේක්ෂව ඒකක මිල අඩුවේ.
- තෝරාගත් භාණ්ඩ ප්‍රමාණයක් සපයයි.

**සිල්ලර හා තොග වෙළඳාම අතර වෙනස්කම්.**

| සිල්ලර | තොග |
|---|---|
| * අවසන් පරිභෝජනයට විකිණීම සිදුකරයි | * නැවත විකිණීම සඳහා විකිණීම සිදුකරයි. |
| * භාණ්ඩ වර්ග රාශියක් දක්නට ලැබේ. | * භාණ්ඩ ප්‍රමාණය සීමිතය |
| * සාපේක්ෂව මිල වැඩිය. | * සාපේක්ෂව මිල අඩුය. |
| * සාමාන්‍යයෙන් වට්ටම් හිමි නොවේ. | * වට්ටම් හිමිය. |

**විදේශීය වෙළඳාම**

යම් රටක් සෙසු රටවල් සමග කරන වෙළඳාම මින් අදහස් වේ. මෙහි ආනයන සහ අපනයන වශයෙන් කොටස් දෙකකි.

ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයන ද්‍රව්‍ය සඳහා උදාහරණ

| අපනයන | ආනයන |
|---|---|
| නිමි ඇඳුම් | ආහාර ද්‍රව්‍ය |
| තේ | රෙදි |
| රබර් | මෝටර් රථ |
| කැපු පොල් | යන්ත්‍ර සූත්‍ර |
| සුළු අපනයන භෝග | විදුලි උපකරණ |
| මැණික් | තිරිඟු පිටි |
| මිනිරන් | ඖෂධ(බෙහෙත් වර්ග) |
| ටයර් | කිරිපිටි |
| | ඉන්ධන |
| | සුවඳ විලවුන් |
| | ටයර් |
| | රත්‍රං |
| | දැව |
| | සිමෙන්ති, යකඩ |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- නිපුණතා මට්ටමට ප්‍රවේශ වීමේ දී පාසල් සමුපකාරයෙන් ශිෂ්‍යයෙකු අභ්‍යාස පොතක් මිලට ගැනීම හා පාසල් සමුපකාරය විසින් එම අභ්‍යාස පොත් සිසුන්ට අලෙවි කිරීම සඳහා නිෂ්පාදන ආයතනයකින් මිලට ගැනීම, යන ගනුදෙනු පිළිබඳ සිසු අදහස් විමසන්න.

- ඒ අනුව සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම පිළිබඳ සරලව හඳුන්වන්න. ඉහත අභ්‍යාස පොත් විදේශ රටවලට ද විකුණන්නේ නම් එය විදේශීය වෙළඳාමට සම්බන්ධවන ආකාරය ද පැහැදිලි කරන්න.

- ඇමුණුම 6.6.1 හි ඇතුළත් සිසු උපදෙස් පත්‍රිකාව සිසුන්ට ලබා දී ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

- සිසුන් පිළිතුරු ඉදිරිපත් කිරීමෙන් පසු විෂය කරුණු මතුවන ආකාරයෙන් සමාලෝචනයක් කරන්න.

**ඇමුණුම 6.6.1**

**සිසු උපදෙස් පත්‍රිකාව**

1. ඔබ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන වෙළෙඳසැල්වල නාමාවලියක් ලැයිස්තුගත කරන්න.
2. එම ලේඛනය ඇසුරින් තොග හා සිල්ලර වෙළඳසැල්, වෙන්කොට ලියා දක්වන්න.
3. එසේ වෙන්කොට හඳුනාගැනීමට භාවිත කළ පදනම කුමක්දැ යි දක්වන්න.
4. සිල්ලර හා තොග වෙළඳාමට අදාල ලක්ෂණ ලැයිස්තුගත කරන්න.
5. ඉහත නිරීක්ෂණය තුළින් සිල්ලර වෙළඳාමේ වැදගත්කම පැහැදිලි කරන්න.
6. රැස් කරගත් තොරතුරු ඉදිරිපත් කිරිමට සූදානම් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**
- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොතේ අදාල පාඩම .


**තක්සේරුකරණය හා ඇගැයීම් නිර්ණායක**
- දේශීය වෙළඳාම හැඳින්වීම.
- සිල්ලර වෙළඳාම යන්න පැහැදිලි කිරිම.
- සිල්ලර වෙළෙඳාමේ වැදගත්කම දැක්වීම.
- සිල්ලර වෙළඳාම සඳහා නිදසුන් තුනක් ලියා දැක්වීම.
- තොග වෙළඳාම පැහැදිලි කිරීම.
- තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම අතර වෙනස දැක්වීම.
- විදේශීය වෙළඳාම පැහැදිලි කිරීම.
- විදේශීය වෙළඳාම සඳහා නිදසුන් හතරක් ඉදිරිපත් කිරිම.

| | | |
|---|---|---|
| **නිපුණතාව 7** | : | **ව්‍යාපාර කළමනාකරණයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.** |
| **නිපුණතා මට්ටම 7.1** | : | කළමනාකරණයේ මූලික හැකියා ලබයි. |
| **කාලච්ඡේද** | : | 03 යි. |
| **ඉගෙනුම් ඵල** | : | මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කර ගත හැකියි. |

- කළමනාකරණ සංකල්පය සරලව පැහැදිලි කිරීමට.
- කළමනාකරණ කාර්යයන් හතර නම් කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**




**කළමනාකරණය**

සංවිධානයක අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂමව හා සඵලදායීව යොදා ගැනීම කළමනාකරණයයි. සම්පත්වලින් උපරිම ලෙස ප්‍රයෝජන ගැනීම කාර්යක්ෂමතාව ලෙස හැඳින්වෙන අතර, නියමිත කාලය තුළ දී අවම පිරිවැයකින් අරමුණු ඉටුකර ගැනීම සඵලදායකත්වය ලෙස හැඳන්විය හැකිය.

**කළමනාකරණ කාර්යයන්**

සැලසුම්කරණය
සංවිධානකරණය
මෙහෙයවීම
පාලනය

**සැලසුම්කරණය :**

සංවිධානයක අරමුණු තීරණය කිරීමත්, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග තීරණය කිරීමේ ක්‍රියාවලියත් සැලසුම්කරණය ලෙස හඳුන්වයි. සැලසුම්කරණය, අනාගතය සමග ව්‍යාපාර කටයුතු සම්බන්ධ වන ආකාරය විදහා දක්වයි.

**සංවිධානකරණය :**
සංවිධානයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට හැකිවන ආකාරයට සංවිධානයේ කාර්යයන් බෙදීම, බලතල, වගකීම් හා රාජකාරී පවරා දීමේ ක්‍රියාවලිය සංවිධානකරණය යි. ව්‍යාපාරයේ අරමුණු කරා ලඟා වීමට හැකිවන පරිදි සම්පත් වෙන්කිරීම ද සංවිධානයෙන් සිදුවේ.

**මෙහෙයවීම**
සංවිධානයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කිරීමේ දී මානව සම්පත නිසි පරිදි යොමු කිරීම පිණිස බලපෑම් ඇති කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවීම ලෙස හැඳින්විය හැකිය. සංවිධානයේ අරමුණු කරා ලඟා වීමට මිනිස් සම්පත නිසි පරිදි මෙහෙයවීම මෙහිදී අපේක්ෂා කෙරේ.

**පාලනය**
සංවිධානයක තීරණය කරන ලද ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවන්නේ ද යන්න සොයා බලා එසේ නොවන්නේ නම්, අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය පාලනය ලෙස සරලව හැඳින්විය හැකිය.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- මෙම නිපුණතා මට්ටමට අදාළව පාඩමට පිවිසීම සඳහා ඇමුණුම 7.1.1 ඇතුළත් පාසලක කළමනාකරණය සිදුවන ආකාරය දැක්වෙන සටහන ඇසුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න. ඒ ඇසුරින් කළමනාකරණ කාර්යයන් පිළිබඳ අදහස මතු කරන්න. මේ සඳහා 7.1.1 ඇමුණුම සිසුන්ට පැහැදිලිව පෙනෙන පරිදි විශාල කර ඉදිරිපත් කරන්න.

- ඕනෑම ආයතනයක හෝ වැඩසටහනක කළමනාකරණය ක්‍රියාත්මක වන බවත් ඒ සඳහා කළමනාකරණ කාර්යයන් ඉටුකළ යුතු බවත්, සිසුන්ට සරලව පැහැදිලි කරන්න. මෙහිදී පාසලක වුවද පන්ති කාමරය, විද්‍යාගාරය, පුස්තකාලය, ආපනශාලාව, අධ්‍යාපන චාරිකා, ක්‍රීඩා උත්සව තුළ කළමනාකරණය ක්‍රියාත්මක වන බව තහවුරු කරන්න. එමෙන්ම ව්‍යාපාරයක, සිල්ලර වෙළෙඳ සැලක, රෝහලක කළමනාකරණය ක්‍රියාත්මක වන බව තහවුරු කරන්න.

- මෙය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා 7.1.2 ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න. එහිදී උචිත ආකාරයට සිසුන්ට ලබාදෙන මාතෘකා තීරණය කරන්න.

- මේ සඳහා ඇමුණුම 7.1.3 තොරතුරු ගොනුව හා 11 ශ්‍රේණියේ පෙළපොතේ මෙම නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණු අධ්‍යයනය කිරීමට ඉඩ සලස්වන්න.

- සිසු ක්‍රියාකාරකමෙන් පසු කණ්ඩායම් තොරතුරු උචිත පරිදි පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් ඇගැයීමට ලක් කරන්න.

## පාසලක කළමනාකරණ කාර්යයන්

1


**සැලසුම්කරණය**

- **පාසලක අරමුණු තීරණය කිරීම.**
  - හොඳ පුරවැසියන් බිහි කිරීම.
  - විනයගරුක සිසුන් බිහිකිරීම.
  - නායකත්ව කුසලතා සහිත සිසුන් බිහිකිරීම.
  - පරිසර හිතකාමී සිසුන් බිහිකිරීම
  - පරිසර හිතකාමී පාසල් පරිසරයක් ඇති කිරීම.
- **අරමුණු ඉටු කර ගැනීමට යොදා ගන්නා වඩාත් උචිත ක්‍රම තීරණය කිරීම.**
  - ක්‍රීඩා උත්සව
  - සෞන්දර්යාත්මක වැඩ සටහන්.
  - ආගමික වැඩ සටහන්.
  - සමිති වැඩ සටහන්.
  - හොඳ ඉගෙනුම් වාතාවරණයක්.
  - සමාජයේ නිසි උපදෙස් ලබා දෙන වැඩසටහන්.

2

**සංවිධානය.**

- **ඉහත අරමුණු ඉටුකර ගැනීමට පාසලක සිටින පිරිසට වැඩ කටයුතු බෙදා දීම (තනතුරු බෙදා දිම)**
  - විදුහල්පති
  - අංශ ප්‍රධානි
  - විෂය ප්‍රධානි
  - විෂය ගුරුවරු
  - ශිෂ්‍ය නායක
  - පන්ති නායක
  - ලිපිකරු
  - කාර්යාල සහායක
  - මුරකරු




3

**මෙහෙයවීම.**

- **ඒ ඒ තනතුරු යටතේ පැවරී ඇති වැඩ නිසිපරිදි ඉටු කර ගැනීමට නායකත්වය ගෙන කටයුතු කිරීම.**
  - විදුහල්පතිවරයා විසින් පාසල මෙහෙයවීම.
  - ගුරුවරයා විසින් සිසුන් මෙහෙයවීම.
  - පන්ති නායකයා විසින් පන්තියේ සිසුන් මෙහෙයවීම.

4

**පාලනය**

- **පාසලක අරමුණු ඉටු කර ගැනීම සඳහා යෙදූ ක්‍රියා මාර්ග නිසිලෙස ක්‍රියාත්මක වින්නේ දැයි සොයා බැලීම සහ එසේ නොවන්නේ නම් ඒ සඳහා පිළියම් යෙදීම පාලනයෙන් සිදුවේ.**
  - දෛනික පිරිසිදු කිරීම් කරන්නේ දැයි ශිෂ්‍ය නායකයන් සොයා බැලීම සහ එසේ නොවන්නේ නම් පිළියම් යෙදීම.
  - පාසලේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නිසි ලෙස ඉටුවී ඇත්දැයි සොයා බැලීම සහ එසේ නොවන්නේ නම් පිළියම් යෙදීම.
  - පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය නිසි ලෙස සිදුවන්නේ දැයි සොයා බැලීම සහ එසේ නොවන්නේ නම් පිළියම් යෙදීම.

ඇමුණුම 7.1.2

**සිසුන් සඳහා උපදෙස් පත්‍රිකාව**

- පහත සඳහන් මාතෘකාවලින් ඔබට ලැබුණු මාතෘකාව හඳුනා ගන්න.
    - සිල්ලර වෙළෙඳ සැල.
    - ඇගලුම් කම්හල.
    - පෞද්ගලික රෝහල.
    - පාසල් පන්ති කාමරය.

- ඔබට ලැබුණු මාතෘකාවට අදාළව පහත සඳහන් ප්‍රශ්නවලට තොරතුරු ගොනු කරන්න.
    - ඔබට ලැබු මාතෘකාවට අදාළ ස්ථානයේ /ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට වඩාත් උචිත ක්‍රියා මාර්ග සඳහන් කරන්න.
    - ඔබට ලද ස්ථානයේ/ආයතනයේ වැඩකටයුතු කිරිමට ඇති තනතුරු මොනවාද ?
    - එම ආයතනයේ/ස්ථානයේ වැඩකටයුතු නිසි ලෙස මෙහෙයවන්නේ කෙසේද ?
    - වැඩකටයතු නිසි පරිදි ඉටු කරනවාදැයි සොයා බලන්නේ කෙසේද ?
    - මාතෘකාවට අදාළව ඔබ ගොනුකළ තොරතුරු අනුව කළමනාකරණය යන්න කෙටියෙන් සඳහන් කරන්න.

ඇමුණුම 7.1.3

**සැලසුම්කරණය**

සංවිධානයක අරමුණු තීරණය කිරීමත්, ඒවා ඉටුකර ගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීමේ ක්‍රියාවලියත් සැලසුම්කරණය යි. සැලසුම්කරණය අනාගතය සමග ව්‍යාපාර කටයුතු සම්බන්ධ වන ආකාරය විදහා දක්වයි.

**සංවිධානකරණය**

සංවිධානයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට හැකිවන ආකාරයට සංවිධානයේ කාර්යයන් බෙදීම, බලතල හා රාජකාරී පවරා දීමේ ක්‍රියාවලිය සංවිධානකරණයයි. සංවිධානයේ ඇති සම්පත් එක් එක් අරමුණු කරා ලගාවීමට හැකිවන පරිදි වෙන්කිරීම මෙහි දී සිදු වේ.

**මෙහෙයවීම**

සංවිධානයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කිරීමේ දී මානව සම්පත නිසි පරිදි නිරත කිරිම පිණිස බලපෑම් ඇති කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවීම ලෙස හැඳින්වේ. සංවිධානයක අරමුණු කරා ලඟා වීමට මානව සම්පත නිසි පරිදි මෙහෙයවීම මෙහිදී අපේක්ෂා කෙරේ.

**පාලනය**

තීරණය කරන ලද ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවන්නේ ද යන්න සොයා බලා එසේ නොවන්නේ නම් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමේ ක්‍රියවලිය පාලනයයි.

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොතේ අදාල පාඩම.

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක -**

- කළමනාකරණය යන්න කෙටියෙන් පැහැදිලි කිරීම
- කළමනාකරණ කාර්යයන් නම් කිරීම.

**නිපුණතාව 7** : **ව්‍යාපාර කළමනාකරණයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : අලෙවිකරණයේ මූලික පදනම සොයා බලයි.


**කාලච්ඡේද** : **03 යි**

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කර ගත හැකියි.

- අලෙවිකරණ සංකල්පය සරළව පැහැදිලි කිරීමට.
- අලෙවි මිශ්‍රයට අයත් සංරචක නම් කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**




**අළෙවිකරණය**

භාණ්ඩ නිෂ්පාදනය කිරිම, මිල කිරීම, ප්‍රවර්ධනය කිරීම හා බෙදාහැරීම තුළින් මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරිම අලෙවිකරණය ලෙස හඳුන්වයි.

අලෙවිකරණය සෑම ව්‍යාපාරයක්ම අනුගමනය කළ යුතු වැදගත් සංකල්පයකි.

**අලෙවිකරණ මිශ්‍රය**
ඉලක්ක වෙළෙඳපොලේ වුවමනා ඉටුවන ආකාරයෙන් ද, යහපත් ප්‍රතිචාර ඇති කර ගැනීම සඳහා ද, ආයතනයකට **පාලනය කළ හැකි විචල්‍යයන් සමූහයක සම්මිශ්‍රණය** අලෙවිකරණ මිශ්‍රය ලෙස හැඳින්වේ.

**ඉලක්ක වෙළෙඳපල යනු** වුවමනා තෘප්තිමත් කිරීමට අපේක්ෂා කරන පාරිභෝගික කොට්ඨාසයයි.

අලෙවිකරණ මිශ්‍රය ප්‍රධාන කොටස් හතරකින් යුක්තය.

**නිෂ්පාදිතය** - අවශ්‍යතා හා වුවමනා ඉටුකෙරෙන ආකාරයෙන් වෙළෙඳපලට ඉදිරිපත් කෙරෙන ඕනෑම දෙයක් නිෂ්පාදිතයක් ලෙස හැඳින්වේ. නිෂ්පාදිත භාණ්ඩ හා සේවා ලෙස වර්ග කළ හැකිය.

**මිල** - කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් මිලදී ගැනීමට පාරිභෝගිකයා ගෙවීමට කැමති මුදල් ප්‍රමාණයයි.

**ස්ථානය** - භාණ්ඩ හා සේවා පාරිභෝගිකයාට ලබා දෙන ආකාරය ස්ථානය ලෙස හැඳින්වේ.

**ප්‍රවර්ධනය** - ව්‍යාපාරයක අලෙවිය වැඩි කර ගැනීම සඳහා යොදා ගන්නා උපක්‍රම ප්‍රවර්ධනය ලෙස හැඳින්වේ.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස් :**


මෙම නිපුණතා මට්ටම ඉටු කර ගැනීම සඳහා පාඩමට පිවිසීමේ දී 7.2.1 හි ඇතුළත් ජංගම දුරකථනයක පින්තූරය (රූප සටහන ) සිසුන්ට ඉදිරිපත් කර සාකච්ඡාවක් මෙහෙයවන්න. එහිදී අලෙවි මිශ්‍රයට අයත් කොටස් පිළිබඳ සාකච්ඡා කරන්න. එනම්

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමේ දී අලෙවි මිශ්‍රය වැදගත්වන බවත් එහි ප්‍රධාන සංරචක
  නිෂ්පාදිතය
  මිල
  ස්ථානය
  ප්‍රවර්ධනය ලෙස හැඳින්විය හැකි බවත් අවබෝධ කරවන්න.

- අනතුරුව ඇමුණුම 7.2.3 හි ඇතුළත් අලෙවි මිශ්‍රය හා ඇමුණුම 7.2.2 සිසු උපදෙස් පත්‍රිකාව සිසුන්ට ලබා දී අදාල ක්‍රියාකාරකමෙහි නියුතු කරවන්න.

- සිසු කණ්ඩායම් හතරකට වෙන්කර එකම භාණ්ඩයක නාමයක් (කිරිපිටිපැකට් එකක්, පෑනක්, පොතක් යන නිෂ්පාදනවලින් එක් භාණ්ඩයක් ) සියලුම සිසුන්ට ලබා දෙන්න.

ඇමුණුම 7.2.1




**සිසු උපදෙස් පත්‍රිකාව**

ඇමුණුම 7.2.2


- අලෙවි මිශ්‍රයේ සටහන හොඳින් අධ්‍යයනය කරන්න.
- අලෙවි මිශ්‍රයට අදාළ පහත සඳහන් මාතෘකාවලින් ඔබට ලැබුණු මාතෘකාව ගැන සාකච්ඡා කරන්න.
    - නිෂ්පාදිතය
    - මිල
    - ස්ථානය
    - ප්‍රවර්ධනය.

- ඔබට ලැබුණු භාණ්ඩයට අදාළව, අලෙවි මිශ්‍රයේ ඔබේ මාතෘකාව හා සම්බන්ධ පහත ප්‍රශ්නවලට පිළිතුරු ගොනු කරන්න.

    - ඔබට ලැබුණු මාතෘකාව කෙටියෙන් හඳුන්වන්න.
    - ඔබට ලැබුණු මාතෘකාව සම්බන්ධව සැලකියයුතු කරුණු "අලෙවි මිශ්‍රය" සටහන/පෙළපොත ඇසුරින් ඉදිරිපත් කරන්න.
    - ඔබ ගොනු කරගත් කරුණු ගුරු උපදෙස් මත පන්තියට ඉදිරිපත් කරන්න.

ඇමුණුම 7.2.3

## "අලෙවි මිශ්‍රය" සටහන




### ගුණාත්මක යෙදවුම්

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොතේ අදාල පාඩම.

### තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක


- අලෙවිකරණය යන්න කෙටියෙන් පැහැදිලි කිරීම.
- අලෙවිකරණ මිශ්‍රයේ සංරචක නම් කිරීම.

| | | |
|---|---|---|
| **නිපුණතාව 8** | **:** | **ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.** |
| **නිපුණතා මට්ටම 8.1** | **:** | ව්‍යාපාරයක වෙළෙඳ ගිණුම පිළියෙල කරයි. |
| **කාලච්ඡේද** | **:** | **05 යි** |
| **ඉගෙනුම් ඵල** | **:** | මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කර ගත හැකිවේ. |

- මූල්‍ය ප්‍රකාශන නම් කිරීමට.
- විකුණුම් පිරිවැය ගණනය කිරීමට.
- වෙළෙඳ ගිණුම පිළියෙල කර දළ ලාභය/අලාභය ගණනය කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**




**මූල්‍ය ප්‍රකාශන :**
ගිණුම්කරණ ක්‍රියාවලියේ අවසාන නිමැවුම මූල්‍ය ප්‍රකාශ වේ. එනම් වෙළඳ හා ලාභාලාභ ගිණුම (ආදායම් ප්‍රකාශනය) හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වේ.

**වෙළෙඳ ගිණුම** -

ව්‍යාපාරයක නිශ්චිත කාලච්ඡේදයක් සඳහා දළ ලාභය හෝ අලාභය ගණනය කිරීමට පිළියෙල කරන ගිණුම **වෙළෙඳ ගිණුමයි.** මෙහි ඇතුළත් වන්නේ විකුණුම් ආදායමත්, එම විකුණුම් ආදායම ලැබීමට වැයවූ විකුණුම් පිරිවැයත් ය.

**වෙළෙඳ ගිණුමේ ආකෘතිය**

-----------------------------ව්‍යාපාරය

**---------------------- දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ ගිණුම**


| | රු. | රු. | | රු. |
|---|---|---|---|---|
| ආරම්භක තොගය | | xx | විකුණුම් | xx |
| + ගැණුම් | xx | | | |
| ගෙනප්මේ කුලී | xx | xx | | |
| | | xx | | |
| − අවසන් තොගය | | (xx) | | |
| විකුණුම් පිරිවැය | | xx | | |
| දළ ලාභය/ප/ගෙ | | xx | | |
| | | xx | | xx |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස් :**


- මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩමට පිවිසීමේ දී ඇමුණුම 8.1.1 හි ඇතුළත් ව්‍යාපාර තොරතුරු සිසුන්ට ඉදිරිපත් කර ව්‍යාපාර දෙකේ ප්‍රතිඵලය ගණනය කිරිම පිළිබඳ සාකච්ඡාවක් කරන්න.
- ව්‍යාපාරයක දළ ලාභය හෝ දළ අලාභය ගණනය කිරිම සඳහා ව්‍යාපාරයක ප්‍රධාන මෙහෙයුම් ආදායම වන විකුණුම් ආදායම් හා විකුණූ භාණ්ඩ මිලදී ගැනීම සඳහා දැරූ වියදම් යොදාගන්නා බව සිසුන්ට අවබෝධ කර දෙන්න. මෙහිදී විකුණුම් පිරිවැය සොයාගන්නා ආකාරය සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- අනතුරුව ව්‍යාපාරයක සිදුවූ ගණුදෙනු ඇසුරින් වෙළෙඳ ගිණුමක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න. ඒ සඳහා ඇමුණුම 8.1.2 හි ඇතුළත් තොරතුරු හා උපදෙස් සැලකිල්ලට ගන්න.
- සිසුන් ගොනුකරගත් තොරතුරු නිවැරදිදැයි සොයා බලන්න. වැරදි නම් නිවැරදි කිරීමට මග පෙන්වන්න..
- මේ ආකාරයේ අභ්‍යාස කීපයක සිසුන් නිරත කරවන්න.

ඇමුණුම 8.1.1

චාන්දනී ව්‍යාපාරය




පියදාස ව්‍යාපාරය




---

ඇමුණුම 8.1.2

2015.12.31 දිනට මොහාන් ව්‍යාපාරයේ තොරතුරු මෙසේය.

| | රු. |
|---|---|
| විකුණුම් | 150000 |
| 2015.01.01 තොගය | 45000 |
| 2015.12.31 තොගය | 15000 |
| ගැණුම් | 88000 |
| ගෙන ඒමේ කුලි | 2000 |

**සිසු උපදෙස් -**

- මෙම ව්‍යාපාරයේ විකුණුම් ආදායම සඳහන් කරන්න.
- මෙම ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය ගණනය කරන්න.
- 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය ගණනය කරන්න.
- 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ ගිණුම පිළියෙල කරන්න.

**ගුණාත්මක යෙදවුම් -**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළ පොතේ අදාල පාඩම

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක**

- වෙළෙඳ ගිණුම පිළියෙල කිරීමේ අරමුණ පැහැදිලි කිරීම.
- ආරම්භක තොගය, ගැණුම්, ගෙන ඒමේ කුලී හා විකුණුම්, වෙළෙඳ ගිණුමේ සටහන් කිරීම.
- විකුණුම් පිරිවැය ගණනය කිරීම.
- දෙන ලද තොරතුරු මත වෙළෙඳ ගිණුම පිළියෙල කර දළ ලාභය හෝ දළ අලාභය ගණනය කිරීම.

**නිපුණතාව 8 : ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 8.2 :** ව්‍යාපාරයක ලාභාලාභ ගිණුම පිළියෙල කරයි.


**කාලච්ඡේද : 10 යි.**

**ඉගෙනුම් ඵල :** මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලගා කර ගත හැකිවේ.

- ලාභාලාභ ගිණුම යන්න පැහැදිලි කිරිමට.
- බෙදාහැරීමේ වියදම් වාර්තා කිරීමට.
- පරිපාලන වියදම් වාර්තා කිරීමට.
- මූල්‍ය හා වෙනත් වියදම් වාර්තා කිරීමට.
- දළ ලාභයට වෙනත් ආදායම් එකතු කිරීමට.
- වෙළෙඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කිරිමට.
- ශුද්ධ ලාභය/අලාභය ගණනය කිරීමට.
- ශුද්ධ ලාභය/අලාභය ප්‍රාග්ධනයට බලපාන ආකාරය දැක්වීමට

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



## ලාභාලාභ ගිණුම

ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය මැන බලන්නේ ලාභාලාභ ගිණුම මගිනි. ව්‍යාපාරයක් ලාභ ලබා තිබේද අලාභයක් ලබා තිබේද යන්න තීරණය කිරීම සඳහා ලාභාලාභ ගිණුම පිළියෙල කරනු ලැබේ. වෙළෙඳ ගිණුම පිළියෙල කිරීම සඳහා අදාළ කරගත් ගිණුම් හැර ඉතිරිවූ ආදායම් හා වියදම් ගිණුම් පදනම් කරගෙන ලාභාලාභ ගිණුම පිළියෙල කරයි. වෙළෙඳ ගිණුමෙන් ලැබූ දළ ලාභය/අලාභයට කාලච්ඡේදයේ ආදායම් හා වියදම් ගැලපීමෙන් ශුද්ධ ලාභය/අලාභය ගණනය කරයි.

## වෙළඳ හා ලාභාලාභ ගිණුමේ ආකෘතිය

**කෝසල ව්‍යාපාරය**
**2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**වෙළෙඳ හා ලාභාලාභ ගිණුම**

| | රු. | රු. | | රු. | රු. |
|---|---|---|---|---|---|
| 2015.01.01 තොගය | | x x | විකුණුම් | | x x x |
| + ගැනුම් | x x | | | | |
| + ගෙන ඒමේ කුලී | x x | x x | | | |
| | | x x | | | |
| අඩුකළා 2015.12.31 තොගය | | (x x) | | | |
| **විකුණුම් පිරිවැය** | | x x | | | |
| දළ ලාභය ප/ගෙ | | x x | | | |
| | | x x x | | | x x x |
| | | | දළ ලාභය ඉ/ගෙ | | x x |
| **බෙදාහැරීමේ වියදම්** | | | | | |
| වෙළෙඳ සේවක වේතන | x | | **වෙනත් ආදායම්:** | | |
| දුන් වට්ටම් | x | | ලද වට්ටම් | x | |
| බොල් ණය | x | | ලද කොමිස් | x | |
| මෝටර් රථ ක්ෂය | x | | ආයෝජන ආදායම් | x | x x |
| | | x x | | | x x x |
| **පරිපාලන විදයම්** | | | | | |
| ගොඩනැගිලි කුලී හා වරිපනම් | x | | | | |
| රක්ෂණ ගාස්තු | x | | | | |
| පරිපාලන විදයම් | x | | | | |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | x | | | | |
| ගොඩනැගිලි ක්ෂය | x | | | | |
| | | x x | | | |
| **මූල්‍ය හා වෙනත් විදයම්** | | | | | |
| බැංකු ණය පොලී | x | | | | |
| බැංකු අයිරා පොලී | x | | | | |
| බැංකු ගාස්තු | x | | | | |
| | | x x | | | |
| | | x x x | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා | | x x | | | |
| | | x x x | | | x x x |

## ආදායම් ප්‍රකාශනය සිරස් ආකෘතියෙන් පෙන්වීම

**කෝසල ව්‍යාපාරය**
**2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනය**

| | රු. | | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | xx |
| (−) **විකුණුම් පිරිවැය** | | | |
| ආරම්භක තොගය | | xx | |
| + ගැණුම් | xx | | |
| ගෙන ඒමේ කුලී | xx | xx | |
| | | xx | |
| − අවසාන තොගය | | (x) | |
| විකුණුම් පිරිවැය | | | xx |
| දළ ලාභය/අලාභය | | | xx |
| වෙනත් ආදායම් | | | x |
| | | | xxx |
| **අඩුකලා** | | | |
| **බෙදාහැරීමේ වියදම්** | | | |
| වෙළඳ සේවක වේතන | x | | |
| දුන් වට්ටම් | x | | |
| බොල් ණය | x | | |
| මෝටර් රථ ක්ෂය | x | (xx) | |
| **පරිපාලන වියදම්** | | | |
| ගොඩනැගිලි කුලී හා වරිපනම් | x | | |
| රක්ෂණ ගාස්තු | x | | |
| පරිපාලන වියදම් | x | | |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | x | | |
| ගොඩනැගිලි ක්ෂය | x | (xx) | |
| **මූල්‍ය හා වෙනත් වියදම්** | | | |
| බැංකු ණය පොලී | x | | |
| බැංකු අයිරා පොලී | x | | |
| බැංකු ගාස්තු | x | (xx) | (xxx) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා | | | xxx |

**වෙළෙඳ හා ලාභාලාභ ගිණුම**

වෙළෙඳ ගිණුම හා **ලාභාලාභ** ගිණුම වෙන් වෙන්ව අධ්‍යයනය කළද සාමාන්‍යයෙන් වෙළෙඳ හා **ලාභාලාභ** ගිණුම එකම ගිණුමක් ලෙස පිළියෙල කරනු ලැබේ.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- මෙම නිපුණතා මට්ටමට අදාළව ප්‍රථම පාඩමට පිවිසීමේ දී ඇමුණුම 8.2.1 හි ඇතුළත් මොහොමඩ් ගේ ව්‍යාපාරයේ තොරතුරු ඇසුරින් ප්‍රථමයෙන්ම වෙළෙඳ ගිණුම පිළියෙල කිරීමට සිසුන් යොමු කරන්න.
- පසුව ඇමුණුම 8.2.2 ඇතුළත් ප්‍රශ්නාවලිය සිසුන්ට ලබාදී ක්‍රියාකාරකමේ නිරත කරවන්න.
- සිසුන්ගේ පිළිතුරු නිවැරදිදැයි සොයා බලා දී ඇති තොරතුරු ඇසුරින් වෙළෙඳ හා ලාභාලාභ ගිණුම එකම ගිණුමක් ලෙස සකස් කිරීමට යොමු කරවන්න.

ඇමුණුම 8.2.1

**මොහොමඩ්ගේ ව්‍යාපාරයේ**

**2015/12/31 දිනට ශේෂ පිරික්සුම**

| ගිණුමේ නම | හර රු. | බැර රු. |
|---|---|---|
| මුදල් ශේෂය | 6,000 | -- |
| බැංකු ශේෂය | 3,000 | -- |
| සුළු මුදල් ශේෂය | 100 | -- |
| ගොඩනැගිලි | 20,000 | -- |
| තොගය 2015.01.01 | 4,000 | -- |
| ගැණුම් | 30,000 | -- |
| බැංකු ණය | | 15,000 |
| විකුණුම් | | 55,000 |
| ණයගැතියෝ | 12,000 | -- |
| ණය හිමියෝ | | 20,000 |
| දුන් වට්ටම් | 2,000 | -- |
| ලද වට්ටම් | -- | 4,000 |
| වැටුප් හා වේතන | 5,500 | -- |
| ලී බඩු | 15,000 | -- |
| රක්ෂණ | 1,200 | -- |
| ප්‍රවාහන ගාස්තු | 800 | -- |
| විදුලිය | 1,000 | -- |
| විවිධ ආදායම් | -- | 1,500 |
| ලිපි ද්‍රව්‍ය | 500 | -- |
| බැංකු ගාස්තු | 900 | -- |
| ගොඩනැගිලි අලුත්වැඩියා | 2,000 | -- |
| මෝටර් රථය | 25,000 | |
| ප්‍රාග්ධනය | -- | 35,000 |
| ප්‍රචාරණ වියදම් | 1,000 | -- |
| බැංකු ණය පොළි | 500 | -- |
| | 130,500 | 130,500 |

**සැ.යු.** මිලදී ගත් තොග සියල්ලම විකුණා ඇත.

ඇමුණුම 8.2.2

**සිසුන් සඳහා ප්‍රශ්නාවලිය**

1. ශේෂ පිරික්සුමේ ඇතුළත් වියදම් හා ආදායම් වෙන් වෙන්ව ලැයිස්තු ගත කරන්න.

2. විකුණුම් පිරිවැය ගණනය කරන්න.

3. වියදම් ලැයිස්තුව පහත ක්ෂේත්‍ර යටතේ වර්ග කර දක්වන්න.
   - බෙදා හැරීමේ වියදම්
   - පරිපාලන වියදම්
   - මූල්‍ය හා වෙනත් වියදම්

4. **2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** වෙළඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න.

5. ශුද්ධ ලාභය හෝ අලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීම පිළිබඳව ජර්නල් සටහන ලියන්න.

6. පන්තියේ අනෙක් සිසුන් ගණනය කළ ශුද්ධ ලාභය හෝ අලාභය සමග ඔබගේ පිළිතුර නිවැරදිදැයි සසඳා බලන්න.

7. ලාභාලාභ ගිණුමේ තොරතුරු ආදායම් ප්‍රකාශයනයක් මගින් ඉදිරිපත් කරන්න.

පිළිතුරු

1.

| ආදායම් | රු. | වියදම් | රු. |
|---|---|---|---|
| විකුණුම් | 55,000 | ගැණුම් | 30,000 |
| ලද වට්ටම් | 4,000 | 2015.01.01 තොගය | 4,000 |
| විවිධ ආදායම් | 1,500 | දුන් වට්ටම් | 2,000 |
| | 60,500 | වැටුප් හා වේතන | 5,500 |
| | | රක්ෂණය | 1,200 |
| | | ප්‍රවාහන ගාස්තු | 800 |
| | | විදුලිය | 1,000 |
| | | ලිපි ද්‍රව්‍ය | 500 |
| | | බැංකු ගාස්තු | 900 |
| | | ගොඩනැගිලි අලුත්වැඩියා | 2,000 |
| | | ප්‍රචාරණ වියදම් | 1,000 |
| | | බැංකු ණය පොලී | 500 |
| | | | 49400 |

2.

| විකුණුම් පිරිවැය | රු. |
|---|---|
| + 2015.01.01 තොගය | 4,000 |
| ගැණුම් | 30,000 |
| විකුණුම් පිරිවැය | 34,000 |

3.

| බෙදාහැරීමේ වියදම් | රු. |
|---|---|
| දුන් වට්ටම් | 2,000 |
| ප්‍රවාහන ගාස්තු | 800 |
| ප්‍රචාරණය | 1,000 |
| | 3,800 |

| පරිපාලන වියදම් | රු. |
|---|---|
| වැටුප් හා වේතන | 5,500 |
| රක්ෂණය | 1,200 |
| විදුලිය | 1,000 |
| ලිපිද්‍රව්‍ය | 500 |
| ගොඩනැගිලි අලුත්වැඩියා | 2,000 |
| | 10,200 |

| මූල්‍ය හා වෙනත් වියදම් | රු. |
|---|---|
| බැංකු ගාස්තු | 900 |
| බැංකු ණය පොලී | 500 |
| | 1,400 |

(4)

**මොහොමඩ් ගේ ව්‍යාපාරය**
**2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**වෙළෙඳ හා ලාභාලාභ ගිණුම**

| | රු. | රු. | | රු. | රු. |
|---|---|---|---|---|---|
| 2015.01.01 තොගය | | 4,000 | විකුණුම් | | 55,000 |
| + ගැණුම් | | 30,000 | | | |
| විකුණුම් පිරිවැය | | 34,000 | | | |
| දළ ලාභය ප/ගෙ | | 21,000 | | | |
| | | 55,000 | | | 55,000 |
| | | | දළ ලාභය ඉ/ගෙ | | 21,000 |
| **බෙදාහැරීමේ වියදම්** | | | | | |
| දුන් වට්ටම් | 2,000 | | ලද වට්ටම් | 4,000 | |
| ප්‍රවාහන ගාස්තු | 800 | | විවිධ ආදායම් | 1,500 | 5,500 |
| ප්‍රචාරණය | 1,000 | 3,800 | | | |
| **පරිපාලන වියදම්** | | | | | |
| වැටුප් හා වේතන | 5,500 | | | | |
| රක්ෂණය | 1,200 | | | | |
| විදුලිය | 1,000 | | | | |
| ලිපි ද්‍රව්‍ය | 500 | | | | |
| ගොඩනැගිලි අලුත්වැඩියා | 2000 | 10,200 | | | |
| **මූල්‍ය හා වෙනත් වියදම්** | | | | | |
| බැංකු ගාස්තු | 900 | | | | |
| බැංකු ණය පොලී | 500 | 1,400 | | | |
| | | 15,400 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙනගියා | | 11,100 | | | |
| | | 26,500 | | | 26,500 |

| | | රු. | රු. |
|---|---|---|---|
| (5) | ලාභාලාභ ගිණුම හර | 11,100 | |
| | ප්‍රාග්ධන ගිණුම | | 11,100 |

**ගුණාත්මක යෙදවුම්**

11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළපොතේ අදාළ පාඩම

**තක්සේරුකරණය හා ඇගැයීම් නිර්ණායක**

- ලාභාලාභ ගිණුම පිළියෙල කිරීමේ අරමුණ පැහැදිලි කිරිම.
- දළ ලාභය හෝ දළ අලාභය, ලාභාලාභ ගිණුමට මාරු කිරීම.
- අදාළ ආදායම් හා වියදම් ලාභාලාභ ගිණුමේ සටහන් කිරිම.
- දෙන ලද තොරතුරු භාවිත කර ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම.

**නිපුණතාව 8** : **ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 8.3** : ගිණුම් කාලච්ඡේදයට අදාල ගෙවිය යුතු වියදම් හා ලැබිය යුතු ආදායම් ගලපයි.


**කාලච්ඡේද** : **05 යි.**

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම් අවසානයේදී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකියි.

- උපචිත පදනම සරලව පැහැදිලි කිරීමට.
- කාලච්ඡේදයට අදාල ගෙවිය යුතු වියදම් ගැලපීමට.
- කාලච්ඡේදයට අදාල ලැබිය යුතු ආදායම් ගැලපීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**




**උපචිත පදනම**

| |
|---|
| ව්‍යාපාරයක නිශ්චිත ගිණුම් කාලච්ඡේදයකට අදාල සියලුම ආදායම් මුදලින් ලැබුණත් නැතත්, වියදම් මුදලින් ගෙව්වත් නැතත් ගිණුම් කාලච්ඡේදයට අදාල නම් මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීමට යොදා ගත යුතු බව උපචිත පදනමෙන් අදහස් වේ. |

**ගෙවිය යුතු වියදම්**

ගිණුම් කාලච්ඡේදයට අදාළ නමුත්, ගිණුම් කාලච්ඡේදයේ අවසාන දින වන විටත්, ගෙවා නොමැති වියදම් ගෙවිය යුතු වියදම් ලෙස සැලකේ.

**ද්විත්ව සටහන**

| | |
|---|---|
| අදාළ වියදම් ගිණුම | හර |
| ගෙවිය යුතු වියදම් ගිණුම | බැර |

හේතුව

අදාල වියදම වැඩිවන නිසා " හර " වේ. ගෙවිය යුතු වියදම් වගකීම් නිසා " බැර " වේ.

**ලැබිය යුතු ආදායම්**

ගිණුම් කාලච්ඡේදයට අදාල නමුත්, ගිණුම් කාලච්ඡේදය අවසාන දින වන විටත් ලැබී නැති ආදායම්, ලැබිය යුතු ආදායම් වේ.

**ද්විත්ව සටහන**

| | |
|---|---|
| ලැබිය යුතු ආදායම් ගිණුම | හර |
| අදාළ ආදායම් ගිණුම | බැර |

හේතුව

ලැබිය යුතු ආදායම් වත්කම් වන නිසා වත්කම් වැඩි වීම " හර " වන අතර අදාළ ආදායම, ආදායම් වැඩි වීමක් නිසා " බැර " වේ.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස් :**

- මෙම නිපුණතා මට්ටමට අදාල පාඩමට පිවිසීමේ දී ඇමුණුම 8.3.1 හි ඇතුළත් නිවසක සිදුවූ ගනුදෙනු ලැයිස්තුව සිසුන්ට ඉදිරිපත් කර, මාසික මුළු ආදායම හා මුළු වියදම ගණනය කිරීම සඳහා සිසුන් බුද්ධි කලම්භනයක යොදවන්න. සිසු ප්‍රතිචාර හුණු පුවරුවේ පෙළගස්වන්න.

- අනතුරුව සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගෙන, ඉහත නිවසේ ජනවාරි මාසය සඳහා ගෙවිය යුතු වියදම් හා ලැබිය යුතු ආදායම්, අදාළ ආදායම් හා වියදම්වලට ගැලපිය යුතු බව අවබෝධ කර දෙන්න.

- ඇමුණුම 8.3.2 හි ඇතුළත් ක්‍රිෂ්ණගේ ව්‍යාපාරයේ සිදුවූ ගණුදෙනු ලැයිස්තුව සිසුන්ට ලබා දී එය කියවීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

- මෙම ක්‍රියාකාරකම පියවර හතරක් යටතේ ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව එක් පියවරක් අවසන් කිරීමෙන් පසු දෙවන පියවර ආරම්භ කරන ආකාරයට සිසුන් ක්‍රියාකාරකමෙහි යෙදවිය යුතුවේ.

- පහත උපදෙස් අනුව සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

    - පිළිතුරු ලිවීමේ දී 8.3.3 හි දැක්වෙන ආකාරයේ වගුවක් පිළියෙල කර ගැනීමට සිසුන්ටඋපදෙස් දෙන්න. එසේ නැතහොත් ඔබ විසින් ඡායා පිටපත් ලබා දෙන්න.

**ගුරු උපදෙස්**

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලියූ පසු ඒ සමගම 8.3.4 ඇමුණුමේ දැක්වෙන ඊට අදාළ දී ඇති පිළිතුර සමග සැසැඳීමට යොමු කරන්න.
  සිසු පිළිතුරුවල වැරදි නිවැරදි බව තහවුරු කරගෙන වැරදි නම් නිවැරදි කිරීමට යොමු කරන්න.

- මේ ආකාරයෙන් පියවරෙන් පියවර අදාළ ප්‍රශ්නයෙන් ප්‍රශ්නයට පිළිතුරු ලියා නිවැරදි පිළිතුරු සමග සැසඳීමට හා නිවැරදි කර ගැනීමට සිසුන් යොමු කරන්න.

**ඇමුණුම 8.3.1**

**නිවසක ජනවාරි මාසයේ සිදුවූ ගණුදෙනු ලැයිස්තුව**

- ජනවාරි මාසයේ ගෙවූ විදුලිය රු. 12,000 යි. තවත් රු. 1,000 ක් ගෙවීමට ඇත.
- මාසිකව රු. 5,000 බැගින් කුලියට දුන් නිවස සඳහා ජනවාරි මස රු. 4,000 ක් පමණක් ලැබී ඇත.

**ඇමුණුම 8.3.2**

**ක්‍රිෂ්ණ ගේ ව්‍යාපාරය**

2015.12.31 න් අවසන් වර්ෂයේ සිදුවූ ගනුදෙනු.

A මසකට රු. 2,500 ක් වූ රක්ෂණ වාරිකය සඳහා වර්ෂය තුළ රු. 25,000 ක් පමණක් ගෙවීම.

B ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ මාසික කුලිය රු. 15,000 කි. වර්ෂය තුළ දී රු. 150,000 ගෙවල් කුලී ගෙවා ඇත.

C ව්‍යාපාරය සතු ඉඩමක් රු. 10,000 ක මාසික බදු කුලියක් යටතේ ව්‍යාපාරිකයෙකුට ලබා දී ඇත. වර්ෂය තුළ දී ලැබුණු මුදල් රු. 100,000 කි.

D වෙනත් ව්‍යාපාරයක් සඳහා මෝටර් රථයක් රු. 60,000 ක මාසික කුලී පදනම මත ලබා දී ඇති අතර වර්ෂය තුළ ලැබී ඇති කුලී ආදායම රු. 500,000 කි.

ඇමුණුම 8.3.3

1 - වන පියවර

ගනුදෙනුවෙන් මතුවන නිවැරදි පිළිතුරට සලකුණ යොදන්න.

| ගනුදෙනුව | ගෙවිය යුතු වියදමකි | ලැබිය යුතු ආදායමකි |
|---|---|---|
| A | | |
| B | | |
| C | | |
| D | | |

2 - වන පියවර

ගනුදෙනුවලට අදාළ ගැලපුම් කළ යුතු වටිනාකම දක්වන්න.

| ගනුදෙනුව | ගැලපිය යුතු ගනුදෙනුව වටිනාකම සමග |
|---|---|
| A | |
| B | |
| C | |
| D | |

3 - වන පියවර

නිවැරදි ද්විත්ව සටහන

| ගනුදෙනුව | හර කළ යුතු ගිණුම රු. | බැර කළ යුතු ගිණුම රු. |
|---|---|---|
| A | | |
| B | | |
| C | | |
| D | | |

(පිළිතුරු සැපයීමෙන් පසු
දී ඇති පිළිතුර සමග සසඳන්න.)

4 - වන පියවර - ද්විත්ව සටහන ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

| ගනුදෙනුව | ගිණුම් | |
|---|---|---|
| A | | |
| B | | |
| C | | |
| D | | |

(පිළිතුරු සැපයීමෙන් පසු
දී ඇති පිළිතුර සමග සසඳන්න.)

ඇමුණුම 8.3.4

**සිසුන් සඳහා ලබාදෙන පිළිතුරු වගුව**

**1 - වන පියවර**

1. ප්‍රශ්නය - ගනුදෙනුවලට අදාළ නිවැරදි පිළිතුරුට "✓"ලකුණ යොදන්න.

| ගනුදෙනුව | ගෙවිය යුතු වියදමකි | ලැබිය යුතු ආදායමකි |
|---|---|---|
| A | ✓ | |
| B | ✓ | |
| C | | ✓ |
| D | | ✓ |

(ඔබගේ පිළිතුර සමග සසඳන්න )

---

**2 - වන පියවර**

2. ප්‍රශ්නය - ගනුදෙනුවලට අදාළ නිවැරදි පිළිතුරුට "✓"ලකුණ යොදන්න.

| ගනුදෙනුව | ගැලපිය යුතු වටිනාකම |
|---|---|
| A | ගෙවිය යුතු රක්ෂණය රු. 5000 |
| B | ගෙවිය යුතු ගෙවල් කුලිය රු. 30000 |
| C | ලැබිය යුතු බදු කුලී ආදායම රු. 20000 |
| D | ලැබිය යුතු මෝටර් රථ ආදායම් රු. 220000 |

(ඔබගේ පිළිතුර සමග සසඳන්න )

---

**3 - වන පියවර**

3. ප්‍රශ්නය - ගනුදෙනුවලට අදාළ නිවැරදි පිළිතුරුට "✓"ලකුණ යොදන්න.

| ගනුදෙනුව | හර කළ යුතු ගිණුම රු. | බැර කළ යුතු ගිණුම රු. |
|---|---|---|
| A | රක්ෂණ ගාස්තු ගිණුම 5000 | ගෙවිය යුතු රක්ෂණ ගාස්තු ගිණුම 5000 |
| B | ගෙවල් කුලී ගිණුම 30000 | ගෙවිය යුතු ගෙවල් කුලී ගිණුම 30000 |
| C | ලැබිය යුතු බදු කුලී ආදායම් ගිණුම 20000 | බදුකුලී ආදායම් ගිණුම 20000 |
| D | ලැබිය යුතු මෝටර් රථ ආදායම් ගිණුම 220000 | මෝටර් රථ ආදායම් ගිණුම 220000 |

(ඔබගේ පිළිතුර සමග සසඳන්න )

4 වන පියවර

**ගනුදෙනුවලට අදාල ද්විත්ව සටහන් ලෙජර්වලට පිටපත් කිරිම.**

A

රක්ෂණ ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| මුදල් ගිණුම | 25,000 | | |
| ගෙවිය යුතු රක්ෂණ ගිණුම | 5,000 | | |

ගෙවිය යුතු රක්ෂණ ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| | | රක්ෂණ ගිණුම | 5000 |

B

ගෙවල් කුලී ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| මුදල් ගිණුම | 150000 | | |
| ගෙවිය යුතු ගෙවල් කුලී ගිණුම | 30000 | | |

ගෙවිය යුතු ගෙවල් කුලී ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| | | ගෙවල්කුලී ගිණුම | 30000 |

C

බදුකුලී ආදායම් ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| | | මුදල් ගිණුම | 100000 |
| | | ලැබිය යුතු බදුකුලී ගිණුම | 20000 |

ලැබිය යුතු බදුකුලී ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| බදුකුලී ආදායම් ගිණුම | 20000 | | |

D

මෝටර් රථ ආදායම් ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| | | මුදල් ගිණුම | 500000 |
| | | ලැබිය යුතු මෝටර් රථ ආදායම් ගිණුම | 220000 |

ලැබිය යුතු මෝටර්රථ ආදායම් ගිණුම

| හර | | බැර | |
|---|---|---|---|
| මෝටර් රථ ආදායම් ගිණුම | 220000 | | |

(ඔබගේ පිළිතුර සමග සසඳන්න )

**ගුණාත්මක යෙදවුම්**

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය 11 ශ්‍රේණිය පෙළ පොත.

**තක්සේරුකරණය හා ඇගැයීම් නිර්ණායක**

- උපචිත පදනම පැහැදිලි කිරීම.
- ගෙවිය යුතු වියදම් ආශ්‍රිත ගණුදෙනු තුනක් ගැලපීම
- ලැබිය යුතු ආදායම් ආශ්‍රිත ගණුදෙනු තුනක් ගැලපීම.

**නිපුණතාව 08** : **ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 8.4** : කාලච්ඡේදයට අදාළ බොල් ණය ගලපයි.


**කාලච්ඡේද** : **03 යි.**

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කර ගත හැකිය.

- බොල්ණය හැඳින්වීමට.
- බොල්ණය ගලපන ආකාරය පැහැදිලි කිරීමට.
- බොල්ණය ගැලපීමට අදාල ද්විත්ව සටහන ඉදිරිපත් කිරීමට.
- බොල්ණය ගැලපීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**




**බොල්ණය**

ණයගැතියන්ගෙන් මුදල් ලබා ගැනීම අපහසු යැයි නිශ්චිතවම තීරණය කළ පසු ලැබිය යුතු ණය ප්‍රමාණය බොල්ණය ලෙස කපා හරිනු ලැබේ. බොල්ණය ව්‍යාපාරයේ වියදමකි. ණයගැතියන් මියයෑම, බුන්වත් වීම වැනි හේතු නිසා ණය නොලැබීමෙන් ව්‍යාපාරවලට බොල් ණය වියදමක් ඇතිවේ. අනෙක් අතට ණයගැති වත්කම් ද අඩුවේ. ඒ අනුව පොදු ජර්නලයේ තබන ද්විත්ව සටහන වන්නේ ,

| ද්විත්ව සටහන | පැහැදිලි කිරීම |
|---|---|
| බොල්ණය ගිණුම හර | (බොල් ණය වියදමකි, වියදම් වැඩි වීම " හර " වේ.) |
| ණයගැති ගිණුම බැර | (ණයගැතියෝ වත්කමකි. වත්කම් අඩුවීම " බැර " වේ ) |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- මෙම නිපුණතා මට්ටමට අදාළ ප්‍රථම පාඩමට පිවිසිමේ දී පහත සඳහන් ප්‍රකාශය සිසුන්ට ඉදිරිපත් කර සිසුන් සමග සාකච්ඡා කරන්න.

| |
|---|
| **"ව්‍යාපාරය ණයට විකුණා ලැබිය යුතු මුදල් නිෂ්චිතවම නොලැබෙන බව දැනගත් විට කල යුත්තේ " කුමක්ද ?** |

- එම ප්‍රමාණය බොල්ණය ලෙස සලකන බවත්, ව්‍යාපාරයේ වියදමක් ලෙස වාර්තා කරන බවත් පැහැදිලි කරන්න.

- එය වඩාත් තහවුරු කිරිම සඳහා ඇමුණුම 8.4.1හි ඇතුළත් සිසු උපදෙස් අනුව සිසු කණ්ඩායම් පහත ක්‍රියාකාරකමේ යොදවන්න.

ඇමුණුම 8.4.1

**සිසුන් සඳහා උපදෙස්**

- පහත සඳහන් සිද්ධි අතරින් ඔබේ කණ්ඩායමට ලැබෙන සිද්ධිය කෙරෙහි අවධානය යොමු කරන්න.
  - සිද්ධිය අධ්‍යයනය 01
  - සිද්ධිය අධ්‍යයනය 02
  - සිද්ධිය අධ්‍යයනය 03

- ඔබට සපයා ඇති සිද්ධි අධ්‍යයනය හොඳින් කියවන්න.
- සිද්ධි අධ්‍යයනයේ දී මතුවන ගැටලුව ඇතිවීමට බලපෑ හේතු මොනවාද ?
- එම ගැටලුව විසඳීමට ඔබ කරන යෝජනා මොනවාද ?
- මෙම ගැටලුව නිසා ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලයට හා වත්කම්වලට වන බලපෑම කුමක්ද ?
- ඔබේ ගැටලුව ගිණුම්ගත කිරීමට අදාළ ජර්නල් සටහන් හා ලෙජර් ගිණුම් දක්වන්න.

**සිද්ධි අධ්‍යයනය 01**

ජයවර්ධන මුදලාලි " ජයවර්ධන ස්ටෝර්ස් " නමින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. ඔහු අත්පිට මුදලට මෙන් ම තම හිතවතුන්ට, ණයට ද භාණ්ඩ විකුණයි. තමන්ට හිතවත් ගණුදෙනුකරුවන්ට ණයට බඩු විකිණීමෙන් රු. 20,000/- ක මුදලක් ව්‍යාපාරයට අයවීමට ඇති අතර සඳුන් නැමති තම ගණුදෙනුකරුවකු හදිසි හෘදයාබාදයකින් මිය ගිය බැවින් ඔහුගෙන් ලැබීමට තිබූ රු. 4000/- ක මුදල ජයවර්ධන මුදලාලිට අය කර ගැනීමට නොහැකි විය.

**සිද්ධි අධ්‍යයනය 02**

සිටුවර්ධන ගේ ව්‍යාපාරය අත්පිට හා ණයට ගනුදෙනු සිදු කරන අතර ණයට විකුණුම්වල වටිනාකම රු. 35,000/- ක් විය. අත්පිට විකුණුම් රු. 80,000/- ක් විය.

ව්‍යාපාරයේ ණයගැතියකු වූ දීපාල් ගේ නාස්තිකාර ජීවිතය නිසා ඔහුගේ දේපළ විනාශ වී, යන එන මං නැති විය. එය උසාවියෙන් නිකුත් කර ඇති බංකොලොත්භාවය පිළිබඳ තීන්දුවකින් ද සනාථ විය. ඔහුගෙන් ව්‍යාපාරයට අයවිය යුතු මුදල රු. 1000/- කි.

**සිද්ධි අධ්‍යයනය 03**

ධනවර්ධන මුදලාලි අත්පිට මෙන් ම ණයට ද බඩු විකුණන ව්‍යාපාරිකයෙකි. භාණ්ඩ ණයට විකිණීමෙන් ලැබිය යුතු මුදල රු. 24,000 ක් බවත්, අත්පිට විකිණීමෙන් රු. 60,000/- ක් ලැබී ඇති බවත් ගිණුම් ලිපිකරුවන්ගෙන් දැන ගත හැකි විය.

ණයගැතියකු වූ අමල් ආ ගිය අතක් දැන ගත නොහැකි ව කාලයක් ගත විය. ඔහුගෙන් ලැබිය යුතු මුදල රු. 4000/- ක් බව ගිණුම් ලිපිකරු වූ ගණකරත්න මහතා ධනවර්ධන මුදලාලිට පවසා ඇත.

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොත
- 8.4.1 ඇමුණුම්වල ඡායා පිටපත්.

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක**

- බොල්ණය යන්න හැඳින්වීම.
- බොල්ණය ඇතිවීමට හේතු තුනක් ඉදිරිපත් කිරිම.
- බොල්ණය ගැලපුම් කිරීමේ ජර්නල් සටහන් දැක්වීම.
- බොල්ණය ගිණුම්ගත කිරීම.
- බොල්ණය ලාභයට හා වත්කමට වන බලපෑම ඉදිරිපත් කිරීම.

**නිපුණතාව 8** : **ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 8.5** : කාලච්ඡේදයට අදාලව ජංගම නොවන වත්කම් ක්ෂය කරයි.


**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කර ගත හැකිය.

- ජංගම නොවන වත්කම් ක්ෂයවීමට හේතු දැක්වීමට.
- සරල මාර්ග ක්ෂය ක්‍රමයට අනුව ක්ෂය ගණනය කිරිමට
- ක්ෂය වෙන් කිරීමේ ගිණුමක් ඇසුරින් ක්ෂය ගිණුම්ගත කිරිමට
- ක්ෂය වියදම නිසා ලාභයට හා වත්කමට වන බලපෑම විස්තර කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

සංකල්ප සිතියම (**Concept Map**)




**දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම**
නැවත විකිණීමේ පරමාර්ථයෙන් තොරව ව්‍යාපාරයේ දිගුකාලීන ප්‍රයෝජනය සඳහා තිබෙන වත්කම් ස්ථාවර වත්කම්වලට අයත් වේ. ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, මෝටර් රථ, ලී බඩු උපකරණ ආදිය එසේ ව්‍යාපාරයේ දිගුකාලීනව භාවිත කරන වත්කම් වේ.

වත්කම් ඵලදායී ජීව කාලය තුළ භාවිතය හෝ යල්පැනීම නිසා අගය අඩු වූ ප්‍රමාණය ක්ෂය ලෙස හැඳින්වේ.

**ක්ෂය වීමට හේතු**

| | | |
|---|---|---|
| ආර්ථික සාධක → | • යල් පැනීම | |
| භෞතික සාධක → | • දිරාපත්වීම | • වැහැරීම |

**සරල මාර්ග ක්ෂය ක්‍රමයට ක්ෂය ගණනය කිරිම**

$$\text{වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය} = \frac{\text{පිරිවැය - සුන්බුන් වටිනාකම}}{\text{ඵලදායී ජීව කාලය}}$$

**ක්ෂය ගිණුම්ගත කිරීමට අදාළ ජර්නල් සටහන -**

ක්ෂය ගිණුම හර
ක්ෂය වෙන් කිරීමේ ගිණුම බැර

**සැ.යු.-**
අ.පො.ස. (සා.පෙළ) මට්ටමේ දී **ජංගම නොවන වත්කම් ක්ෂය කිරිම, සරල මාර්ග ක්ෂය ක්‍රමය,** හා **ක්ෂය ගිණුම්ගත කිරීම** යන කරුණු 3 පමණක් සරලව සාකච්ඡා කිරීම ප්‍රමාණවත්ය.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්** -

- මෙම නිපුණතා මට්ටමට පිවිසීමේ දී පහත සඳහන් ප්‍රකාශය සිසුන්ට ඉදිරිපත් කරන්න.

  " මීට වසර 5 කට පෙර රුපියල් 20,00 000 කට මිලදී ගත් මෝටර් රථයක් අද වන විට පැවතිය හැකි තත්ත්වය කුමක් වේද ?

- සිසු අදහස් හුණු පුවරුවේ පෙළ ගස්වන්න.
- ඒ තුළින් ක්ෂය වීමට හේතු මතුකර ගැනීමට උත්සාහ කරන්න.
- ක්ෂය ගිණුම්ගත කළ යුතු බව හා එය වාර්තා කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් ඉදිරිපත් කරන්න.
- ක්ෂය කිරීම සම්බන්ධ වඩාත් තහවුරුකර ගැනීම සඳහා ඇමුණුම 8.5.1 සිද්ධිය හා ඇමුණුම 8.5.2 සිසුන්ට ලබාදී ක්‍රියාකාරකමේ නිරත කරවන්න.
- සිසුන් ප්‍රතිචාර දැක්වූ පසු ඒ පිළිබඳ ගිණුම් තැබීම සාකච්ඡා කරන්න.

ඇමුණුම 8.5.1

## සිද්ධි අධ්‍යයනය

සුනිමල් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කරන කර්මාන්තයක හිමිකරුවෙකි. ඔහු තම නිෂ්පාදන කටයුතු සඳහා රු. 30,000/- කට යන්ත්‍රයක් මිලට ගත්තේ ය. එය මිලදී ගත් ආයතනය විසින් එය අවුරුදු 05 ක් පාවිච්චි කල හැකි බවට ඇස්තමේන්තු කරන ලදී. අවුරුදු 05 අවසානයේ දී එම යන්ත්‍රය රු. 5000/- කට අලෙවි කිරීමට සුනිමල් අදහස් කරයි.

අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරිම සඳහා රු. 80,000/- කට අත් ට්‍රැක්ටරයක් ද ඔහු විසින් මිලට ගන්නා ලදී. සමාගමේ අදහස පරිදි ට්‍රැක්ටරය වසර 10 ක් පාවිච්චි කළ හැකිය. එය වසර 10 ක් අවසානයේ දී රු. 10,000/- කට අලෙවි කිරීමට ඔහු අදහස් කරයි. ව්‍යාපාරය දියුණු වන විට මෙම අත් ට්‍රැක්ටරය විකුණා ලොරි රථයක් ගැනීමේ අදහසක් ද ඔහුට ඇත.

ඇමුණුම 8.5.2

**සිසුන් සඳහා උපදෙස් -**

- පහත සඳහන් මාතෘකා අතරින් ඔබේ කණ්ඩායමට ලැබී ඇති මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
  - බ්ලොක් ගල් නිපදවන යන්ත්‍රය
  - අත් ට්‍රැක්ටරය
- ඇමුණුම 8.5.1 සිද්ධි අධ්‍යයනය කරන්න.
- ඔබට ලැබුණු මාතෘකාවට අදාල වත්කම් කුමන අදහසකින් මිලදී ගෙන ඇත්දැයි දක්වන්න.
- වත්කමක් දිගුකලක් පාවිච්චි කිරීමෙන් වත්කමේ වටිනාකමට වන බලපෑම පිළිබඳ ව කුමක් කිව හැකි ද ?
- ඔබේ පිළිතුරට හේතුව ඉදිරිපත් කරන්න.
- ඔබට අදාළ ජංගම නොවන වත්කමෙහි වටිනාකම අඩු වීමට හේතු ඉදිරිපත් කරන්න.
- වත්කමට අදාළ වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගණනය කරන්න.
- ක්ෂයවීම් ප්‍රමාණය ගිණුම්ගත කිරිමට අදාළ ජර්නල් සටහන් පහත දැක්වෙන ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

යන්ත්‍ර ගිණුම

යන්ත්‍ර ක්ෂය ගිණුම

යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොත
- අදාල ඇමුණුම්වල ඡායා පිටපත්

**තක්සේරු හා ඇගැයීම් නිර්ණායක**

- ජංගම නොවන වත්කමක් ක්ෂය වීමට හේතු තුනක් ඉදිරිපත් කිරීම.
- සරල මාර්ග ක්ෂය ක්‍රමයට වත්කමක ක්ෂය ගණනය කිරීම.
- වාර්ෂික ක්ෂය ගිණුම්ගත කිරීම.
- වාර්ෂික ක්ෂය ප්‍රමාණය ලාභය හා වත්කමට සිදුකරන බලපෑම පැහැදිලි කිරීම.

**නිපුණතාව 8** : **ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරයි.**

**නිපුණතා මට්ටම 8.6** : ව්‍යාපාරයේ ලාභදායිත්වය හා මූල්‍ය තත්ත්වය අනාවරණය කරයි.


**කාලච්ඡේද** : **07 යි**

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකිය.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ප්‍රාග්ධනය සටහන් කිරීමට.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වන අයිතම ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කිරීමට.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම.
- ගැලපීම් සහිත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය /ශේෂ පත්‍රය**

නිශ්චිත දිනකට ව්‍යාපාරයක ඇති වත්කම්, වගකීම් හා ප්‍රාග්ධනයෙහි වටිනාකම දක්වන ප්‍රකාශනය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය/ ශේෂ පත්‍රය වේ.

ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීමෙන් පසු ඉතිරිවී ඇති ගිණුම්වල ශේෂ එනම් වත්කම්, වගකීම් හා ප්‍රාග්ධනය යන ශේෂ පදනම් කරගෙන ශේෂ පත්‍රය පිළියෙළ කරයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක ආකෘතිය පහත පරිදි වේ.

-

------------------------------------ ව්‍යාපාරය

------------------- දිනට

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | | රු. | | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ශුද්ධ අගය රු. |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | | xxx | **ජංගම නොවන වත්කම්** | | | |
| + ශුද්ධ ලාභය | | x | ඉඩම් හා ගොඩනැගිලි | x x x | x x | xx |
| | | xxx | යන්ත්‍ර උපකරණ | x x x | x | xx |
| - ගැනිලි | | (x) | | | | |
| | | xxx | | xxx | xx | xx |
| | | | ආයෝජන | | | x |
| ජංගම | | | | | | |
| නොවන වගකීම් | | | ජංගම වත්කම් | | | |
| බැංකු ණය | | x | තොගය | | x | |
| | | | ණයගැතියෝ | | x | |
| ජංගම වගකීම් | | | ලැබියයුතු ආදායම් | | x | |
| ණය හිමියෝ | x | | බැංකු ශේෂය | | x | |
| ගෙවිය යුතු වියදම් | x | | අතැති මුදල් | | | |
| | | x x | | | | |
| | | | | | | xx |
| | | xxx | | | | xxx |

---------------------- ව්‍යාපාරය

------------------ දිනට

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | පිරිවැය රු | සමුච්චිත ක්ෂය රු. | ශුද්ධ අගය රු. |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | xxx | xx | xx |
| යන්ත්‍ර උපකරණ | xxx | x | xx |
| | xxx | xx | xx |
| ආයෝජන | | | xx |
| ජංගම වත්කම් | | | |
| තොගය | | x | |
| ණයගැතියෝ | | x | |
| ලැබිය යුතු ආදායම් | | x | |
| බැංකු ශේෂය | | x | |
| අතැති මුදල් | | x | xx |
| | | | xxx |
| ප්‍රාග්ධනය හා වගකීම් | | | |
| ප්‍රාග්ධනය | | xx | |
| + ශුද්ධ ලාභය | | xx | |
| | | xx | |
| - ගැනිලි | | (x) | |
| | | | xx |
| ජංගම නොවන වගකීම් | | | |
| බැංකුණය | | | x |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | x | |
| ගෙවිය යුතු වියදම් | | x | xx |
| | | | xxx |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස් :**

- මෙම නිපුණතා මට්ටමට අදාල ක්‍රියාකාරකමට ප්‍රවේශ වීම සඳහා පහත සඳහන් ගිණුම්කරණ සමීකරණය හුණු පුවරුවේ ලියා එය ලේඛනයක් ලෙස ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වත්කම් | | | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
| ගොඩනැගිලි | + | ණයගැතියෝ | + | මුදල් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
| **91,000** | + | **37,000** | + | **21,000** | = | **140,000** | + | **9,000** |

- ඇමුණුම 8.6.1 ට අදාළ බිමල් ව්‍යාපාරයේ තොරතුරු සිසුන්ට ලබා දෙන්න.
- එම ගණුදෙනු කියවා තේරුම් ගැනීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී ඇමුණුම 8.6.2 ට ඇතුළත් වගුව ලබා දෙන්න.
- එම වගුවේ පළමු පියවර සඳහා සිසුන්ට පිළිතුරු ලිවීමට උපදෙස් දී, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- පසුව ඇමුණුම 8.6.3 හි ඇතුළත් පිළිතුරු වගුවෙන් පළමු පියවරට අදාළ පිළිතුරු පමණක් ලබා දී සිසුන්ගේ පිළිතුර සමග සැසඳීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
- මේ ආකාරයෙන් පියවර 6 ම අවසන් වන තුරු පියවරෙන් පියවර සිසුන් ලවා පිළිතුරු ලබාගෙන එක් එක් පියවරට අදාළව ඔබ විසින් සපයන පිළිතුරු සමග සැසැඳීමට එක් එක් පියවර අනුගමනය කරන්න.

**ඇමුණුම 8.6.1**

බිමල් විසින් පවත්වාගෙන යන බිම්මල් ව්‍යාපාරයේ 2015.12.31 දිනට පැවති වත්කම්, වගකීම් හා හිමිකම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ඉඩම් | 400,000 |
| ගොඩනැගිලි | 200,000 |
| යන්ත්‍ර සූත්‍ර | 300,000 |
| මෝටර් රථ | 400,000 |
| ලී බඩු හා උපකරණ | 150,000 |
| ආයෝජන | 100.000 |
| **2015.12.31 දිනට ක්ෂය වෙන් කිරීම්** | |
| ගොඩනැගිලි | 20,000 |
| යන්ත්‍ර සූත්‍ර | 60,000 |
| මෝටර් රථ | 80,000 |
| ලී බඩු හා උපකරණ | 15,000 |
| තොගය | 220,000 |
| ණය ගැතියෝ | 80,000 |
| බැංකු මුදල් | 65,000 |
| අතැති මුදල් | 34,000 |
| බැංකු ණය | 400,000 |

| | | |
|---|---|---|
| | | රු. |
| ණය හිමියෝ | | 51.000 |
| ගෙවිය යුතු විදුලිය ගාස්තු | | 4,000 |
| ලැබිය යුතු ගෙවල් කුලී | | 6,000 |
| 2015.01.01 | ප්‍රාග්ධනය | 1,000,000 |
| 2015.12.31 | දිනෙන් අවසන් - වර්ෂයේ ශුද්ධ ලාභය | 349,000 |
| ගැනිලි | | 24,000 |

ඉහත සඳහන් තොරතුරු ඇසුරින් බිමල්ගේ ව්‍යාපාරයේ 2015.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කරන්න.

**සිසු උපදෙස් -**

- එහිදී ඔබට ලැබෙන පිළිතුරු සැපයිය යුතු වගුවේ පියවරෙන් පියවර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙහිදී පළමු පියවරට පිළිතුරු සැපයූ පසු ගුරුවරයා විසින් ලබාදෙන පිළිතුරු සමග නිවැරදිදැයි සසඳා බලන්න.
- ඒ ආකාරයට පියවරෙන් පියවර ගුරු උපදෙස් මත ප්‍රශ්නවලට පිළිතුරු සසඳමින් ක්‍රියාකාරකමේ යෙදෙන්න.

**ඇමුණුම 8.6.2**

**පිළිතුරු ලබාදිය යුතු වගුව**

**1 වන පියවර**

| **ජංගම නොවන වත්කම්** | **පිරිවැය රු.** | **සමුච්චිත ක්ෂය රු.** | **ධාරණ වටිනාකම රු.** |
|---|---|---|---|
| ඉඩම් | 400 000 | —— | 400 000 |
| ගොඩනැගිලි | 200 000 | 20 000 | 180 000 |
| යන්ත්‍ර සූත්‍ර | -- | 60 000 | --- |
| මෝටර් රථ | 40 0000 | --- | --- |
| ලී බඩු උපකරණ | --- | --- | --- |
| | ---- | ---- | ---- |
| ආයෝජන | | | ---- |

**2 වන පියවර**

| | | |
|---|---|---|
| ජංගම වත්කම් | රු. | |
| තොගය | 220 000 | |
| ණයගැතියෝ | ---- | |
| ලැබිය යුතු ගෙවල් කුලී | | |
| බැංකු මුදල් | ---- | |
| අතැති මුදල් | ---- | |
| | | --------- |

**3 වන පියවර** **රු.**

| | |
|---|---|
| 2015.01.01 ප්‍රාග්ධනය | 1000000 |
| **එකතුකලා** - ශුද්ධ ලාභය | ------ |
| | ------ |
| **අඩු කලා** - ගැනිලි | (24000) |
| 2015.12.31 ප්‍රාග්ධනය | ----------- |

**4 වන පියවර**

| | | |
|---|---|---|
| | | රු. |
| ජංගම නොවන වගකීම් | | |
| බැංකු ණය | | ----- |

**5 වන පියවර** **රු.**

| | | |
|---|---|---|
| ජංගම වගකීම් | | |
| ණයහිමියෝ | ----- | |
| ගෙවිය යුතු විදුලිය ගාස්තු | ----- | ----- |

**6 වන පියවර**

**බිමල් ගේ ව්‍යාපාරය**
**2015/12/31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | රු. | රු. | ජංගම නොවන වත්කම් | පිරිවැය රු. | ස.ක්ෂය රු. | ධාරණ වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| 2015.01.01 ප්‍රාග්ධනය | | ---- | | | | |
| + ශුද්ධ ලාභය | | ---- | ඉඩම් | ---- | —— | ---- |
| - ගැනිලි | | (----) | ගොඩනැගිලි | ---- | ---- | ---- |
| | | | යන්ත්‍ර සූත්‍ර | ---- | ---- | ---- |
| 2015.12.31 ප්‍රාග්ධනය | | ---- | මෝටර් රථ | ---- | ---- | ---- |
| | | | ලී බඩු | ---- | ---- | ---- |
| | | | | ---- | ---- | ---- |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| බැංකු ණය | | ---- | ආයෝජන | | | ---- |
| **ජංගම වගකීම්** | | | **ජංගම වත්කම්** | | | |
| | | | තොග | | ---- | |
| ණයහිමියෝ | ---- | | ණයගැතියෝ | | ---- | |
| ගෙවිය යුතු විදුලිය | ---- | | ලැබිය යුතු ගෙවල් කුලී | | ---- | |
| | | ---- | බැංකු මුදල් | | ---- | |
| | | | අතැති මුදල් | | ---- | ---- |

පිළිතුරු සහිත වගුව

1 වන පියවර සඳහා පිළිතුරු සඳහා පිළිතුරු ඇමුණුම 8.3.3

| ජංගම නොවන වත්කම් | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු |
|---|---|---|---|
| ඉඩම් | 400,000 | ——— | 400,000 |
| ගොඩනැගිලි | 200,000 | 20,000 | 180,000 |
| යන්ත්‍ර සූත්‍ර | 300,000 | 60,000 | 240,000 |
| මෝටර් රථ | 400,000 | 80,000 | 320,000 |
| ලී බඩු | 150,000 | 15,000 | 135,000 |
| | 1,450,000 | 175,000 | 1,275,000 |
| ආයෝජන | | | 100,000 |

2 වන පියවර සඳහා පිළිතුරු

| ජංගම වත්කම් | රු. | රු. |
|---|---|---|
| තොග | 220,000 | |
| ණයගැතියෝ | 80,000 | |
| ලැබිය යුතු ගෙවල් කුලී | 6,000 | |
| බැංකු මුදල් | 65,000 | |
| අතැති මුදල් | 34,000 | 405,000 |

3 වන පියවර සඳහා පිළිතුරු

| | රු. | රු. |
|---|---|---|
| 2015.01.01 ප්‍රාග්ධනය | | 1,000,000 |
| **එකතුකළා** - ශුද්ධ ලාභය | | 349,000 |
| **අඩුකළා** - ගැනිලි | | (24,000) |
| 2015.12.31 ප්‍රාග්ධනය | | 1,325,000 |

4 වන පියවර සඳහා පිළිතුරු

| ජංගම නොවන වගකීම් | රු. | රු. |
|---|---|---|
| බැංකු ණය | | 400,000 |

5 වන පියවර සඳහා පිළිතුරු

| | රු. | රු. |
|---|---|---|
| **ජංගම වගකීම්** | | |
| ණය හිමියෝ | 51,000 | |
| ගෙවිය යුතු විදුලිය ගාස්තු | 4,000 | 55,000 |

**බිමල්ගේ ව්‍යාපාරය**
**2015.12.31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**6 වන පියවර සඳහා පිලිතුරු**

| | රු. | රු. | ජංගම නොවන වත්කම් රු. | පිරිවැය රු. | ස.ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|---|---|---|---|
| 2015.01.01 ප්‍රාග්ධනය | 1,000,000 | | ඉඩම් | 400,000 | --- | 400,000 |
| + ශුද්ධ ලාභය | 349,000 | | ගොඩනැගිලි | 200,000 | 20,000 | 180,000 |
| - ගැනිලි | (24,000) | | යන්ත්‍ර සූත්‍ර | 300,000 | 60,000 | 240,000 |
| | | | මෝටර් රථ | 400,000 | 80,000 | 320,000 |
| 2015/12/31 ප්‍රාග්ධනය | | 1,325,000 | ලී බඩු | 150,000 | 15,000 | 135,000 |
| | | | | 415,000 | 175,000 | 1,275,000 |
| **ජංගම නොවන වගකීම්** | | | ආයෝජන | | | 100,000 |
| බැංකු ණය | | 400,000 | | | | |
| **ජංගම වගකීම්** | | | **ජංගම වත්කම්** | | | |
| ණය හිමියෝ | 51,000 | | තොගය | | 220,000 | |
| ගෙවිය යුතු විදුලිය ගාස්තු | 4,000 | | ණයගැතියෝ | | 80,000 | |
| | | 55,000 | ලැබියයුතු ගෙවල් කුලිය | | 6,000 | |
| | | | බැංකු මුදල් | | 65,000 | |
| | | | අතැති මුදල් | | 34,000 | 405,000 |
| | | 1,780,000 | | | | 1,780,000 |

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොත

**තක්සේරු හා ඇගැයීම් නිර්ණායක**

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ප්‍රාග්ධනය සටහන් කිරීම
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වන අයිතම ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කර දැක්වීම
- දෙන ලද තොරතුරු පදනම් කර ගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම

ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහිත අභ්‍යාස කිහිපයක් සිසුන්ට ලබා දෙන්න.

**නිපුණතාව 8** : ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරයි.

**නිපුණතා මට්ටම 8.7** : ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන දක්වමින් ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙළ කරයි.


**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකිය.

- ලාභ අරමුණු කර නොගත් සංවිධාන හැඳින්වීමට.
- ලාභ අරමුණු කර නොගත් සංවිධානයක අරමුණු දැක්වීමට.
- ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන නම් කිරීමට.
- ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙළ කිරීමේ අවශ්‍යතාව දැක්වීමට.
- ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙළ කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



**ලාභ අරමුණු කර නොගත් සංවිධාන**

ලාභ අරමුණු කර නොගෙන සමාජ සුභ සාධනය අරමුණු කර ගෙන පවත්වා ගෙන යන ක්‍රීඩා සංගම්, සුභසාධක සමිති හා පුජ්‍ය ආයතන වැනි සංවිධාන ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස හැඳින්විය හැකිය.

**ලාභ අරමුණු කර නොගත් සංවිධානවල මූල්‍ය ප්‍රකාශන**

**ලැබීම් හා ගෙවීම් ගිණුම**

මෙය වෙළෙඳ ව්‍යාපාරයක් පිළියෙළ කරන මුදල් පොතට සමානය.

**ආදායම් හා වියදම් ගිණුම**

කාලච්ඡේදයට අදාළ සියලුම ආදායම් හා වියදම් පදනම් කරගෙන මෙම ගිණුම පිළියෙළ කරන අතර එය තුලනය කිරීමෙන් අතිරික්තය හෝ ඌණතාව ගණනය කළ හැකිය. මෙය උපචිත පදනම මත පිළියෙල කරයි. වෙළඳ ව්‍යාපාරයක ලාභාලාභ ගිණුම හා බොහෝ දුරට සමානයි.

**සාමාජික මුදල්**

වාර්ෂිකව සාමාජිකයන්ගෙන් අයකර ගන්නා ගාස්තුව වන අතර, මෙය ලාභ නොලබන සංවිධානයක ප්‍රධාන ආදායම් මාර්ගය වේ.

**මුදල් ගිණුමේ ආකෘතිය**

**-------------------- සමිතිය**
**------------- දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලැබීම් හා ගෙවීම් ගිණුම**

| ලැබීම් | රු. | ගෙවීම් | රු. |
|---|---|---|---|
| මුදල් ශේෂය | x | කුලිය | x |
| සාමාජික මුදල් | x | උපකරණ ගැණුම් | x |
| පරිත්‍යාග | x | සංග්‍රහ වියදම් | x |
| ලොතරැයි අලෙවිය | x | ශේෂය ප/ගෙ. | x |
| | xx | | xx |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- මෙම ක්‍රියාකාරකමට ප්‍රවේශ වීමේ දී පාසලේ ශිෂ්‍ය සමිතියක සිදුවිය හැකි ගනුදෙනු හා සාමාන්‍ය ව්‍යාපාරයක සිදුවන ගණුදෙනු අතර සම්බන්ධතාව විමසමින් ලාභ අරමුණු කර නොගත් සංවිධාන හා ඒවායේ අරමුණු , පවත්වාගෙන යන ගිණුම් හා මුදල් ගිණුම් තබන ආකාරය පිළිබඳ සරල හැඳින්වීමක් කරන්න.
- ඇමුණුම 8.7.1 ට ඇතුළත් තොරතුරු පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කිරිමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඇමුණුමේ ඇතුළත් තොරතුරු කියවීමෙන් පසු ඇමුණුම 8.7.2 ට ඇතුළත් ගිණුම සිසුන්ට ලබා දි 8.7.1 සඳහන් තොරතුරු මත පිළිතුරු සපයන ලෙස දැනුවත් කරන්න.
- තව දුරටත් සිසු අනාවරණ පැහැදිලි කරමින්, සුදුසු පරිදි විෂය කරුණු ගොනු කර ගැනීමට ඉඩකඩ ලබා දෙන්න.

ඇමුණුම 8.7.1

" ඉර හඳ " ක්‍රීඩා සමාජයේ 2015.12.31 න් අවසන් වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.

1. **ගෙවීම්**

| | රු. |
|---|---|
| ගමන් වියදම් | 1,500 |
| මුරකරු වැටුප් | 7,500 |
| තැපැල් ගාස්තු | 500 |
| ක්‍රීඩා භාණ්ඩ ගැනුම් | 2,000 |
| රක්ෂණය | 1,500 |
| ලොතරැයි ටිකට් සඳහා මුද්‍රණ වියදම් | 2,000 |

**ලැබීම්**

| | |
|---|---|
| සාමාජික ගාස්තු | 4,000 |
| පරිත්‍යාග | 9,000 |
| ලොතරැයි ටිකට් විකුණුම් | 5,000 |

2. මුදල් ශේෂය 2015.1.1 2,000

3. ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් ගණන 100 ක් වන අතර එක් අයකුගෙන් අයකරන වාර්ෂික සාමාජික ගාස්තුව රු. 50 කි.

4. 2015.12.31 දිනට වැටුප් හා රක්ෂණ රු. 500 බැගින් ගෙවිය යුතුව ඇත.

ඇමුණුම 8.7.2

**පහත සඳහන් ගිණුමේ අදාළ ස්ථානවල නිවැරදි පිළිතුර ලියා දක්වන්න.**

**"ඉරහඳ " ක්‍රීඩා සමාජයේ**
**2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලැබීම් හා ගෙවීම් ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| 2015/01/01 ශේෂය ඉ/ගෙ | 2000 | | |
| | | | ---------- |
| | --------- | | ---------- |
| | --------- | | ---------- |
| | --------- | 2015/12/31 ශේෂය ප/ගෙ | ---------- |
| | ------- | | --------- |

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොතේ අදාල පාඩම.

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක**

- ලාභ අරමුණු කර නොගත් සංවිධාන හැඳින්වීම.
- ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිදසුන් හතරක් ලියා දැක්වීම.
- ලාභ අරමුණු කර නොගත් සංවිධානයක අරමුණු ලියා දැක්වීම.
- ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙළ කිරීමේ අවශ්‍යතාව දැක්වීම.
- දෙන ලද තොරතුරු මත ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙළ කිරීම.

**නිපුණතාව 8** : **ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරයි.**

**නිපුණතාව 8.8** : ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් හා වියදම් ගිණුම පිළියෙළ කරයි.


**කාලච්ඡේද** : **04 යි.**

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කර ගත හැකිය.

- ආදායම් හා වියදම් ගිණුම පැහැදිලි කිරිමට.
- ආදායම් හා වියදම ගිණුම පිළියෙළ කිරීමේ අවශ්‍යතාව දැක්වීමට.
- ආදායම් හා වියදම් ගිණුම පිළියෙළ කිරීමට.
- අතිරික්තය හෝ ඌණතාව ගණනය කිරීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

සංකල්ප සිතියම (**Concept Map**)




**ආදායම් හා වියදම් ගිණුම / ආදායම් ප්‍රකාශය**
කාලච්ඡේදයට අදාල සියලුම ආදායම් හා වියදම් පදනම්කර ගෙන මෙම ගිණුම පිළියෙළ කරයි. මෙම ගිණුම පිළියෙළ කිරීමේ අරමුණ වන්නේ කාලච්ඡේදයට අදාළ " අතිරික්තය හෝ ඌණතාව " ගණනය කිරීමයි. උපචිත පදනම මත මෙය පිළියෙල කරයි.

**-------------------------------------- සමිතිය**

**----------- න් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| wdodh ï | | |
| සාමාජික ගාස්තු | x | |
| පරිත්‍යාග ලැබීම් | x | |
| වෙනත් ආදායම් | x | |
| පරණ පුවත්පත් විකුණුම් ආදායම් | x | xxx |
| **වියදම්** | | |
| ගෙවල් කුලී | x | |
| වැටුප් | x | |
| විදුලිය | x | |
| දුරකථන | x | (xx) |
| **අතිරික්තය / ඌනතාව** | | xxx |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස්**

- 8.7.1 හි ඇතුළත් පෙර ක්‍රියාකාරකමට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය යටතේ ඇති උපදෙස් මෙහිදී ද අනුගමනය කරමින් ආදායම් හා වියදම් ගිණුම පිළියෙළ කිරීමට සිසුන් යොමු කරවන්න.

  මේ ආකාරයෙන් අභ්‍යාස කිහිපයක් සිසුන්ට ලබා දී ලැබීම් හා වියදම් ගිණුම හා ආදායම් හා ගෙවීම් ගිණුම පිළියෙළ කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**
- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළ පොතේ අදාළ පාඩම

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක**
- ආදායම් හා වියදම් ගිණුම හැඳින්වීම.
- ආදායම් හා වියදම් ගිණුම පිළයෙළ කිරීමේ අරමුණ දැක්වීම.
- ආදායම් හා වියදම් ගිණුමට ඇතුළත්වන ගනුදෙනු හයක් ලියා දැක්වීම.
- ආදායම් හා වියදම් ගිණුම පිළියෙළ කිරිම.

**නිපුණතාව 8** : **ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරයි.**

**නිපුණතා මට්ටම 8.9** : නිෂ්පාදන පිරිවැය ලේඛනයක් සකස් කරයි.


**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කරගත හැකිය.

- නිෂ්පාදන පිරිවැය පැහැදිලි කිරීමට
- නිෂ්පාදන පිරිවැය මූලිකාංග නම් කර පැහැදිලි කිරීමට.
- ප්‍රාථමික පිරිවැය ගණනය කිරිමට.
- නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ගණනය කිරිමට.
- මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමට
- නිෂ්පාදන ඒකක පිරිවැය ගණනය කිරීමට.
- ඒකකයක විකුණුම් මිල තීරණය කිරිමට.
- පැතුරුම් පතක් භාවිතයෙන් හෝ සුදුසු වෙනත් ක්‍රමයක් භාවිතයෙන් පිරිවැය ලේඛනයක් පිළියෙල කර නිෂ්පාදන ඒකකයක විකුණුම් මිල ගණනය කරන ආකාරය සරලව ඉදිරිපත් කිරිමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



ව්‍යාපාරයක් විසින් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දරණ ලද පිරිවැය ගණනය කිරීමේ අපේක්ෂාවෙන් නිෂ්පාදන පිරිවැය ලේඛනයක් පිළියෙල කරනු ලැබේ.

| | | |
|---|---|---|
| සෘජු වියදම් | - | නිශ්පාදිත භාණ්ඩයකින් සෘජුවම හඳුනාගත හැකි පිරිවැය |
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | - | භාණ්ඩ නිෂ්පාදනයේ දී ඒකකයක් පාසා පැහැදිලිව හඳුනාගත හැකි භෞතික සම්පත්වල වටිනාකම. |
| සෘජු ශ්‍රමය පිරිවැය | - | භාණ්ඩ නිපදවීමට සෘජුවම දායකවන ශ්‍රමිකයන්ට ගෙවන වැටුප්. |
| සෘජු වෙනත් පිරිවැය | - | භාණ්ඩ ඒකකයක් සඳහා සෘජුව හඳුනාගත හැකි ද්‍රව්‍ය හා ශ්‍රමය වියදම් පිරිවැය නොවන වෙනත් වියදම්. |
| ප්‍රාථමික පිරිවැය | - | භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට දරන ලද සියළුම සෘජු වියදම්වල එකතුව. |
| වක්‍ර වියදම් | - | භාණ්ඩයක් නිපදවීමේ දී දරන ලද නමුත් නිෂ්පාදන ඒකකයක් සමග සෘජුව ම හඳුනාගත නොහැකි වියදම්. වක්‍ර ද්‍රව්‍ය පිරිවැය, වක්‍ර ශ්‍රම පිරිවැය, සහ වක්‍ර වෙනත් පිරිවැය මගින් මුළු වක්‍ර වියදම් ගොඩනැගේ. |

**නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** -

නිෂ්පාදන ඒකකයට අදාළ පැහැදිළිව හඳුනාගත නොහැකි සමස්ත නිෂ්පාදනය වෙනුවෙන් දරන වියදම නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයයි.

**මුළු නිෂ්පාදන පිරිවැය** = ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

නිදසුනක් මගින් පැහැදිලි කිරිම

පොතක් මුද්‍රණය කිරිම සඳහා වන නිෂ්පාදන පිරිවැය

| | | |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | - | කඩදාසි තීන්ත. |
| සෘජු ශ්‍රම පිරිවැය | - | මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු වැටුප්. |
| සෘජු වෙනත් | - | නිපදවන ඒකකයක් සඳහා කර්තෘට ගෙවන පුරස්කාරය |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | - | ගම් සහ නූල් සඳහා යන පිරිවැය, නිෂ්පාදන සුපරීක්ෂකවරුන්ගේ වැටුප්, මුද්‍රණ අංශයේ විදුලි බිල. |

- නිෂ්පාදන ඒකකයක පිරිවැය = $\dfrac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{මුළු නිෂ්පාදන ඒකක ගණන}}$
- ඒකකයක විකුණුම් මිල

  ඒකකයක නිෂ්පාදන පිරිවැයට ලාභාන්තිකය එකතු කිරීමෙන් ඒකකයක විකුණුම් මිල තීරණය වේ.

| ඒකකයක විකුණුම් මිල = ඒකකයක නිෂ්පාදන පිරිවැය + ඒකකයක ලාභාන්තිකය. |
|---|

**නිෂ්පාදන පිරිවැය ලේඛනය**

| | රු. | රු. |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | x | |
| සෘජු ශ්‍රමය පිරිවැය | x | |
| සෘජු වෙනත් පිරිවැය | x | |
| **ප්‍රාථමික පිරිවැය** | | xx |
| කර්මාන්තශාලා බදුකුලී | x | |
| සුපරීක්ෂණ වැටුප් | x | |
| යන්ත්‍ර ක්ෂය | x | |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | xx |
| **මුළු නිෂ්පාදන පිරිවැය** | | xxx |

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස් -**

- මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩමට පිවිසීමේ දී ගුරු මේසය/පුටුව/කළුලෑල්ල/ අල්මාරිය/පොතක්/පෑනක් වැනි භාණ්ඩයක් නම් කර හෝ පෙන්වා එය නිෂ්පාදනය කිරීමට යොදාගත් සම්පත් පිළිබඳ විමසමින් සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, සෘජු වෙනත් වියදම් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය හෙවත් වක්‍ර වියදම් යන අයිතම මතු කර දක්වන්න.

- ඇමුණුම 8.9.1 ඇතුළත් ඇමුණුම සිසුන්ට අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

- ඇමුණුම 8.9.1 ඇතුළත් ප්‍රශ්නාවලිය හා 8.9.2 ට අදාළ පිළිතුරු සැකසීම සඳහා පියවරයන් 6 ඇතුළත් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.

- පිළිතුරු ලිවීම පියවරෙන් පියවර සාකච්ඡා කළ යුතු වේ.

- පළමු පියවරට ඇතුළත් ප්‍රශ්නය සඳහා සිසුන් විසින් ලබා දී ඇති පිළිතුරු ගුරුවරයා විසින් සපයන 8.3.3 ඇමුණුමේ ඇතුළත් පළමු පියවරයට අදාළ පිළිතුරු සිසුන්ට ලබා දී පිළිතුරු සැසඳීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා ගුරු භවතුන්ගේ සංවර්ධනාත්මක මැදිහත්වීම අවශ්‍ය වේ.

- මේ අයුරින් 2 වන පියවරේ සිට 6 පියවර දක්වා සිසුන්ට පළමුව පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දී පසුව 8.9.3 ඇතුළත් පිළිතුරු, සිසු පිළිතුරු සමග සසඳන්න. මේ සඳහා ගුරු භවතුන්ගේ සංවර්ධනාත්මක මැදිහත්වීම අවශ්‍යවේ.

• පැතුරුම් පතක් මගින් පිරිවැය ලේඛනය සකස් කිරීම පහත දැක්වේ.

<table>
<tr><th>පියවර</th><th>ක්‍රියාකාරකම</th><th>විධානය</th></tr>
<tr><td>1</td><td>පරිගණකයේ Excel worksheet එකක් විවෘත කර ගැනීම .</td><td>start<br>M.S. Excel WorkSheet</td></tr>
<tr><td>2</td><td>Excel worksheet එකේ පිරිවැය ලේඛනයක් සකස් කර ගැනීම.<br><br>ප්‍රාථමික පිරිවැය හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ මුළු එකතුව ලබාගැනීමට ( Σ ) හෝ (sum )විධානය භාවිත කරන්න.</td><td>
<table>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td>සෘජු ද්‍රව්‍ය</td><td>x</td><td></td></tr>
<tr><td>සෘජු ශ්‍රමය</td><td>x</td><td></td></tr>
<tr><td>සෘජු වෙනත් වියදම්</td><td>x</td><td></td></tr>
<tr><td>ප්‍රාථමික පිරිවැය</td><td></td><td>xx</td></tr>
<tr><td>කර්මාන්ත ශාලා බදු කුලී</td><td>x</td><td></td></tr>
<tr><td>සුපරීක්ෂණ වැටුප්</td><td>x</td><td></td></tr>
<tr><td>යන්ත්‍ර ක්ෂය</td><td>x</td><td></td></tr>
<tr><td>නිෂ්පාදන පොදු කාර්ය</td><td></td><td>x</td></tr>
<tr><td>මුළු නිෂ්පාදන පිරිවැය</td><td></td><td>xx</td></tr>
</table>
</td></tr>
<tr><td>3</td><td>ඒකක පිරිවැය ගණනය කිරීම = (මුළු පිරිවැය/නිෂ්පාදන ඒකක ගණන) ඇතුළත් කර විධානය ලබා දෙන්න.</td><td>$\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදන ඒකක ගණන}}$</td></tr>
</table>

**ඇමුණුම 8.9.1**

වඩු කාර්මිකයෙකු වූ නිමල් ලී වැඩ පළක් ආරම්භ කිරීම සඳහා රු. 120 000 ක් වැය කර තමාට අවශ්‍ය වඩු කාර්මික උපකරණ මිල දී ගත් අතර වඩු මඩුව පවත්වාගෙන යාම සඳහා මසකට රු. 20 000 ක කුලියකට ගොඩනැගිල්ලක් ලබා ගන්නා ලදී. වඩු කර්මාන්තශාලාවේ සේවය කිරීම සඳහා වඩු කාර්මිකයෙකු සහ මසකට රු. 10 000 ක වැටුපකට මුරකරුවකු බඳවා ගත් අතර වැටුප් නිසි පරිදි ගෙවන ලදී.

නිමල් අල්මාරි නිපදවීම සඳහා රු. 90 000 ක් වටිනා තේක්ක ලී මිලදී ගත් අතර 2015 ජනවාරි මස නිපදවන ලද අල්මාරි 10 ක් වෙනුවෙන් වඩු කාර්මිකයාට රු. 50000 ක වැටුපක් ගෙවන ලදී. එසේම අල්මාරිවල මෝස්තර නිර්මාණය කිරීම සඳහා රු. 10 000 ක් ගෙවන ලදී. ඔහුට අල්මාරි පොලිෂ් කිරීම සඳහා වැලි කඩදාසි හා පොලිෂ් මිල දී ගැනීමට රු. 8 000 ක් ද, ඇණ මිල දී ගැනීමට රු. 2000 ක් ද දැරීම ට සිදු විය.

2015 ජනවාරි මාසයේ නිෂ්පාදනය කරන ලද අල්මාරි වෙනුවෙන් රු. 6000 ක විදුලි වියදමක් දැරීමට සිදුවූ අතර වඩු කාර්මික යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා රු. 4000 ක වියදමක් ද දැරීය. එසේ ම වඩු කාර්මික යන්ත්‍රවල ගෙවී යාම වෙනුවෙන් වඩු කාර්මික උපකරණ පිරිවැය මත 10% ක් ක්ෂය කරන ලදී.

ඉහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර **පහත සඳහන් ප්‍රශ්නාවලිය** සඳහා පිළිතුරු 8.9.2 වගුවට අනුව ලියන්න. එක් පියවරකට පිළිතුරු ලබා දීමෙන් පසු ගුරුවරයා ලබාදෙන පිළිතුරු සමග සසඳන්න.

1. මෙම ව්‍යාපාරය දරන ලද වියදම් සඳහා පිරිවැය ලැයිස්තුවක් සකස් කරන්න.
2. ඉහත හඳුනාගත් පිරිවැය මූලිකාංග අනුව වර්ග කර දක්වන්න.
3. ඉහත හඳුනා ගන්නා ලද පිරිවැය මූලිකාංග අනුව අල්මාරි නිෂ්පාදනය සඳහා දරන ලද ප්‍රාථමික පිරිවැය හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ගණනය කරන්න.
4. 2015 ජනවාරි මාසය සඳහා පිරිවැය ලේඛනයක් සකස් කර මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
5. එක් අල්මාරියක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
6. අල්මාරියක නිෂ්පාදන පිරිවැයට 40% ක ලාභාන්තිකයක් එකතු කර අල්මාරියක විකුණුම් මිල තීරණය කළේ නම්, එක් අල්මාරියක විකුණුම් මිල කොපමණ ද ?

පිළිතුරු සැපයිය යුතු වගුව

ඇමුණුම 8.9.2

01වන පියවර

පිරිවැය ලැයිස්තුව

| | වියදම | වටිනාකම රු. |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

02වන පියවර

ප්‍රාථමික පිරිවැය

| | | | රු. |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | - | ලී/ දැව | --------- |
| සෘජු ශ්‍රමය | - | වඩු කාර්මිකයාගේ වැටුප | --------- |
| සෘජු වෙනත් වියදම් | - | මෝස්තර නිර්මාණය සඳහා | 10000 |

නිෂ්පාදන පොදු කාර්යපිරිවැය -

| | | |
|---|---|---|
| - | ------------------------------ | ---------- |
| - | ------------------------------ | ---------- |
| - | ------------------------------ | ---------- |
| - | ------------------------------ | ---------- |
| - | ------------------------------ | ---------- |
| - | ------------------------------ | ---------- |
| - | ------------------------------ | ---------- |

පෙර වැඩ - = යන්ත්‍ර ක්ෂය වටිනාකම = යන්ත්‍ර පිරිවැය x ක්ෂය ප්‍රතිශතය

= -----------

= -----------

3 වන පියවර

ප්‍රාථමික පිරිවැය

(........................+ ......................... + ........................) = රු. ----------

නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

(........................+ ......................... + ........................) = රු. -----------

4 වන පියවර

**2015 ජනවාරි මාසය සඳහා**
**පිරිවැය ලේඛනය**

| | | රු. | රු. |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | --------------- | ------------- | |
| සෘජු ශ්‍රම | --------------- | 50,000 | |
| සෘජු වෙනත් වියදම් | --------------- | ------------- | |
| **ප්‍රාථමික පිරිවැය** | | | |
| | | | ------------- |
| | --------------- | ----------- | |
| | --------------- | ------------ | |
| | --------------- | ------------ | |
| | --------------- | ------------ | |
| | --------------- | ------------ | |
| | --------------- | ------------ | |
| | ------------- | ----------- | |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | | --------------- |
| **මුළු නිෂ්පාදන පිරිවැය** | | | --------------- |

5 වන පියවර

| | | |
|---|---|---|
| ඒකකයක නිෂ්පාදන පිරිවැය | = | මුළු නිෂ්පාදන පිරිවැය / මුළු නිෂ්පාදන ඒකක ගණන |
| | = | ------------------------------ |
| ∴ අල්මාරියක නිෂ්පාදන පිරිවැය | = | රු. -------------------- |

6 වන පියවර

| | | |
|---|---|---|
| ඒකකයක විකුණුම් මිල | = | ඒකකයක පිරිවැය + ඒකකයක ලාභාන්තිය |
| | = | ------------------- + --------------- |
| ∴ අල්මාරියක විකුණුම් මිල | = | රු. -------------------- |

ඇමුණුම 8.9.3

**පිළිතුරු වගුව**

1 පියවර සඳහා පිළිතුරු

| | රු. |
|---|---|
| උපකරණ | 120,000 |
| දැව | 90,000 |
| ගොඩනැගිලි කුලිය | 20,000 |
| මුරකරු වැටුප | 10,000 |
| වඩු කාර්මික වැටුප | 50,000 |
| මෝස්තර නිර්මාණය සඳහා | 10,000 |
| වැලි කඩදාසි සහ පොලිෂ් | 8,000 |
| ඇණ | 2000 |
| විදුලිය | 6,000 |
| උපකරණ ක්ෂය | 1,000 |
| යන්ත්‍ර අලුත් වැඩියාව | 4,000 |

දෙවන පියවර සඳහා පිළිතුරු

| | | | රු. |
|---|---|---|---|
| **ප්‍රාථමික පිරිවැය** | | | |
| සෘජු ද්‍රව්‍ය | - | ලී /දැව | 90 000 |
| සෘජු ශ්‍රමය | - | වඩු කාර්මිකයාගේ වැටුප | 50 000 |
| සෘජු වෙනත් වියදම් | - | මෝස්තර නිර්මාණය සඳහා | 10 000 |
| | | | |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | - | වැලි කඩදාසි හා පොලිෂ් | 8 000 |
| | - | ඇණ | 2 000 |
| | - | කම්හල් මුරකරුගේ වැටුප | 10 000 |
| | - | කම්හල් කුලී | 20 000 |
| | - | කම්හල් විදුලිය | 6 000 |
| | - | යන්ත්‍ර අලුත් වැඩියාව | 4 000 |
| | - | යන්ත්‍ර ක්ෂය | 1 000 |

පෙර වැඩ

යන්ත්‍ර ක්ෂය වටිනාකම = යන්ත්‍ර පිරිවැය x ක්ෂය ප්‍රතිශතය

$$= 120\ 000 \times \frac{10}{100} \times \frac{1}{12}$$

$$= \text{රු. } 12000 \times \frac{1}{12}$$

$$= \text{රු. } \underline{\underline{1000}}$$

තුන්වන පියවර සඳහා පිළිතුර

ප්‍රාථමික පිරිවැය
(රු. 90000 + රු.50000 +රු. 10000 ) = රු. 150000

නිශ්පාදන පොදු කාර්ය පිරිවැය
(රු.10000 +රු. 100000 +රු. 31000 = රු. 51000

**හතරවන පියවර සඳහා පිළිතුරු**

**2015 ජනවාරි මාසය සඳහා පිරිවැය ලේඛනය**

| | | | |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | - ලී | 90 000 | |
| සෘජු ශ්‍රමය පිරිවැය | - වඩු කාර්මිකයාගේ වැටුප | 50 000 | |
| සෘජු වෙනත් පිරිවැය | - මෝස්තර නිර්මාණය සඳහා | 10 000 | |
| **ප්‍රාථමික පිරිවැය** | | | 150000 |
| | - වැලි කඩදාසි හා පොලිෂ් | 8 000 | |
| | - ඇණ | 2 000 | |
| | - කම්හල් මුරකරුගේ වැටුප | 10 000 | |
| | - කම්හල් කුලී | 20 000 | |
| | - විදුලිය | 6 000 | |
| | - යන්ත්‍ර අලුත්වැඩියාව | 4 000 | |
| | - යන්ත්‍ර ක්ෂය | 1 000 | |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | | 51000 |
| **මුළු නිෂ්පාදන පිරිවැය** | | | 201000 |

**පස්වන පියවර සඳහා පිළිතුරු**

ඒකකයක නිෂ්පාදන පිරිවැය = $\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදන ඒකක ගණන}}$

= රු. $\frac{201000}{10}$

= රු. 20,100

∴ අල්මාරියක නිෂ්පාදන පිරිවැය = රු. 20,100

**හයවන පියවර සඳහා පිළිතුරු**

ඒකකයක විකුණුම් මිල = ඒකකයක පිරිවැය + ඒකකයක ලාභාන්තිකය රු.

= රු. 20100 + (20,100 x 40%)

= රු. 20,100 + රු.8,040

= රු. 28,140/-

∴ අල්මාරියක විකුණුම් මිළ = රු. 28,140/-

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණය  අධ්‍යයනය පෙළ පොතේ අදාළ පාඩම.
- ආශ්‍රිත ඇමුණුම්

**තක්සේරු හා ඇගැයීම් නිර්ණායක**


- නිෂ්පාදන පිරිවැය පැහැදිලි කිරීම.
- නිෂ්පාදන පිරිවැය මූලිකාංග නම් කර පැහැදිලි කිරිම.
- ප්‍රාථමික පිරිවැය ගණනය කිරීම
- නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ගණනය කිරීම
- නිෂ්පාදන ඒකක පිරිවැය හා විකුණුම් මිල ගණනය කිරිම.
- පැතුරුම් පතක් භාවිතයෙන් හෝ සුදුසු වෙනත් ක්‍රමයක් භාවිතයෙන් නිෂ්පාදන ඒකකයක විකුණුම් මිල ගණනය කරන ආකාරය සරලව ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| **නිපුණතාව 9** | : | **ආයෝජනය පිළිබඳ විමර්ශනය කරමින් යෝග්‍ය තීරණවලට එළැඹේ.** |
| **නිපුණතා මට්ටම 9.1** | : | ආයෝජනයේ වැදගත්කම විමර්ෂනය කරයි. |
| **කාලච්ඡේද** | : | **05 යි.** |
| **ඉගෙනුම් ඵල** | : | මෙම ක්‍රියාකාරකම අවසානයේදී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකිය. |

- ආයෝජනයේ වැදගත්කම පැහැදිලි කිරිමට.
- විවිධ ආයෝජන මාර්ග දැක්වීමට.
- සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු මූලික සාධක දැක්වීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



**ආයෝජනය -**
පුද්ගලයකු තමා උපයන ආදායමින් ඉතිරි කර ගත් මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභ අපේක්ෂාවෙන් යෙදවීම ආයෝජනය ලෙස ඉතා සරලව දැක්විය හැකිය.

**විවිධ ආයෝජන මාර්ග**

- ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම.
- බැංකුවක ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යාම.
- ඉඩම්, ස්වර්ණාභරණ වැනි දේපල මිලදී ගැනීම.
- කොටස් වෙළඳපලේ ආයෝජනය කිරීම.
  (මෙම විෂය කරුණු 9.1.1 ක්‍රියාකාරකමේ දී සාකච්ඡා කෙරේ.)

**ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බලන ප්‍රධාන සාධක.**

- අරමුණු
- අවදානම
- ප්‍රතිලාභ.

**එක් එක් ආයෝජන මාර්ගවලින් පොදුවේ ලබාගත හැකි ප්‍රතිලාභ**

- පොලී ආදායම
- සුරක්ෂිත බව
- ප්‍රාග්ධන ලාභ
- ලාභාංශ ලැබීම
- ඇපසුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.

**විවිධ ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ**

**ඉතිරි කිරීමේ ගිණුම**

- පොලී ආදායමක් හිමිවීම.
- මුදලට ඇති සුරක්ෂිත බව.
- වෙනත් ප්‍රතිලාභ
  උදා - ත්‍යාග/ලොතරැයි දිනුම් ඇදීම.

**ස්ථාවර තැන්පතු**

- සාපේක්ෂව ඉහළ බැංකු පොලී ආදායමක් ලැබීම.
- මුදලට ඇති සුරක්ෂිත බව.
- ඇපයට තබා ණය මුදලක් ලබාගත හැකිවීම.

**දේපළ මිලදී ගැනීම**

- ස්ථාවර වත්කම හිමිකරුවකු වීම.
- එම දේපළ පරිහරණය කළ හැකිවීම.
- ප්‍රාග්ධන ලාභ ලබා ගත හැකිවීම.
- ඇපයට තබා ණය මුදල් ලබා ගත හැකිවීම.
- කුළියට/බද්දට දීමට හැකිවීම.

**ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා උපදෙස් :**

- මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩමට පිවිසීමේ දී පහත දැක්වෙන වාක්‍යය සුදුසු ආකාරයට ලියා සෑම සිසුවෙකුටම පෙනෙන පරිදි ඉදිරිපත් කරන්න.

| |
|---|
| ඔබට රු. 10,00,000 ක ලොතරැයි දිනුමක් ලැබුණේ නම්. |

- ඒ පිළිබඳ සිසු ප්‍රතිචාර පුවරුවේ පෙළ ගස්වා, එයට හේතු විමසන්න.
- ඒ අනුව ආයෝජනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
- **අනතුරුව ආයෝජන මාර්ග පිළිබඳ තවදුරටත් දැනගැනීම සඳහා පහත ක්‍රියාකාරකමේ නිරත කරවන්න.**
- ඇමුණුම 9.1.1 සිද්ධිය හා ඇමුණුම 9.1.2 සිසු උපදෙස් පත්‍රිකාව සිසු කණ්ඩායම් වලට බෙදා දී කාර්යයේ යොදවන්න.
- ඒ සඳහා 11 ශ්‍රේණියේ පෙළපොතේ අදාළ පාඩම කියවීම සඳහා යොමු කරන්න.
- ගොනුකර ගත් තොරතුරු පංතියට ඉදිරිපත් කිරීමට සිසුන් සූදානම් කරවන්න.
- සිසුන් ඉදිරිපත් කළ තොරතුරු හා අතිරේක විෂය කරුණු එක්රැස් කර සිසු දැනුම වර්ධනය කර ගැනීමට හැකිවන පරිදි උචිත සටහනක් ලබාදෙන්න.

**ඇමුණුම 9.1.1**

**සිද්ධි අධ්‍යයනය**

රජයේ සේවකයකු වූ මහින්ද රංවැල්ල මහතා වසර 35 ක රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබීය. ඔහුගේ දියණිය නිමාලි රාජ්‍ය බැංකුවක සේවය කරයි. පුතා මිලින්ද ව්‍යාපාර කළමනාකරණ උපාධිධාරියෙකි. ඔහු විවිධ ව්‍යාපාර කටයුතුවල නිරත වේ.

මහින්ද රංවැල්ල මහතා ගේ විශ්‍රාම දීමනාවක් ලෙස එකවර ලැබුණු රු. 10,00,000 ක මුදල සහ ඔහු ඉතිරිකර ගෙන තිබූ රු. 20,00,000 ක මුදලක් ඔහු සතුව විය.

මෙම මුදල හොඳ ප්‍රතිලාභයක් ලැබෙන පරිදි යොදවන ආකාරය ගැන රංවැල්ල මහතා කල්පනා කරමින් සිටියි. නමුත් ආයෝජනය ගැන ඔහුට අවබෝධයක් නැත. මෙම අදහස තම පවුලේ අය සමග සාකච්ඡා කිරීමේ දී විවිධ අදහස් මතුවිය. මෙහිදී,

නිමාලි පවසන්නේ, මේ දිනවල බැංකු පොලී අනුපාතය ඉහළ මට්ටමක පවතින බැවින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරන ලෙසයි. එහෙත් මිලින්ද පවසන්නේ මේ දිනවල ඉඩම් හා රත්තරං මිල තරමක් පහළ ගොස් ඇති නිසා ඒ පිළිබඳව ද සිතා බලා එවැන්නක හෝ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කරන ලෙසයි.

ඇමුණුම 9.1.2

## සිසු උපදෙස් පත්‍රිකාව

1. ඔබට ලැබුණු සිද්ධිය හොඳින් අධ්‍යයනය කරන්න.
2. පෙළපොත අධ්‍යයනය කර, ආයෝජනය, යන්න කෙටියෙන් ලියා දක්වන්න.
3. මෙම සිද්ධියෙන් මතුවන ආයෝජන මාර්ග තුනක් නම් කරන්න.
4. පහත සඳහන් ආයෝජන මාර්ග, හඳුනාගෙන ඒ එක් එක් ආයෝජන මාර්ගයක් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ 2 ක් ලියන්න.
   - බැංකු තැන්පතු
   - දේපළවල ආයෝජනය
5. පුද්ගලයකු තම මුදල් ආයෝජනය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
6. මහින්ද රංවැල්ල මහතා ට මුදල් ආයෝජනය කළ හැකි තවත් ආයෝජන මාර්ග නම් කරන්න.
7. ඔබ ගොනුකරගත් තොරතුරු පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- 11 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළපොතේ අදාල පාඩම,

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක :**
- ආයෝජනයේ වැදගත්කම පැහැදිලි කිරීම.
- ආයෝජනය කළ හැකි විවිධ මාර්ග නම් කිරීම.
- විකල්ප ආයෝජන මාර්ග අතුරින් වඩාත් උචිත ආයෝජන මාර්ගයක් තෝරා ගන්නා ආකාරය දැක්වීම.
- ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක ලියා දක්වයි.

**නිපුණතාව 9** : **ආයෝජනය පිළිබඳ විමර්ෂණය කරමින් යෝග්‍ය තීරණවලට එළැඹේ.**

**නිපුණතා මට්ටම 9.2** : කොටස් වෙළඳපොළ ආයෝජනයේ වැදගත්කම විමසයි.


**කාලච්ඡේද** : **05**

**ඉගෙනුම් ඵල** : මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟා කර ගත හැකිය.

- කොටස් වෙළඳපොළ ආයෝජනයේ වැදගත්කම පෙන්වීමට.
- සාමාන්‍ය කොටස් මිලදී ගැනීමේ වැදගත්කම පෙන්වා දීමට.
- භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමේ වැදගත්කම පෙන්වා දීමට.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් :**
**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම (Concept Map)**



**කොටස් වෙළඳපොළ ආයෝජනය**
ශ්‍රී ලංකාවේ කොටස් ගණුදෙනු කිරිම සඳහා කොළඹ කොටස් වෙළඳපොළ පිහිටුවා ඇත. මෙම වෙළෙඳපලේ කටයුතු කරන්නේ ලියාපදිංචි සමාගම් පමණි. කොළඹ කොටස් වෙළඳපොළ කටයුතු මෙහෙයවන්නේ කොළඹ කොටස් හුවමාරුව විසිනි. එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් මෙහි කටයුතු අධීක්ෂණය කෙරේ.

**කොටස් මිලට ගැනීම**

සමාගම්වල කොටස් මිලට ගැනීම සඳහා මුදල් ආයෝජනය කිරීම තවත් එක් ආයෝජන මාර්ගයකි. කොටස් වෙළඳපොළ හරහා එම කටයුතු සිදුවේ. සීමිත පොදු සමාගමක් තම කොටස් නිකුත් කරන අවස්ථාවක හෝ පවතින සමාගමක කොටස් මිලදී ගත් කෙනෙකු එම කොටස් අලෙවි කරන විට හෝ කොටස් මිලදී ගත හැකිය. එම කොටස් වෙළෙඳපලේ ගනුදෙනු කළ හැකිය. කොටස් සඳහා ලැබෙන ප්‍රතිලාභ ලාභාංශය වේ. සමාගමක් නිකුත් කරනු ලබන කොටස් වර්ග අතර සාමාන්‍ය කොටස් ප්‍රධාන තැනක් ගනී.

**සාමාන්‍ය කොටස්**

සීමිත සමාගම් විසින් තම ප්‍රාග්ධනය සපයා ගැනීම සඳහා කොටස්කරුවන්ට නිකුත් කරනු ලබන කොටස් වර්ගයක් ලෙස සාමාන්‍ය කොටස් හැඳින්වේ. මෙම කොටස්වල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ කිපයකි.

**සාමාන්‍ය කොටස් මිලදී ගැනීම නිසා වන ප්‍රතිලාභ**

* ඡන්ද බලය
* ලාභාංශ ලැබීම.
* ප්‍රාග්ධන ලාභ ලැබීම.
* කොටස් අලෙවිකර මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව.
* සුරැකුම් ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව.
* වෙනත් ප්‍රතිලාභ ලැබීම.
    * අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට හැකියාව ලැබීම.
    * සමාගමට සම්බන්ධ තීරණ ගැනීමේ හැකියාව ලැබීම.

**ලාභාංශ ලැබීම**
සමාගමේ පවතින ලාභය මත හා සමාගමක අරමුණු මත ලාභාංශ වටිනාකම තීරණය කෙරේ. සාමාන්‍යයෙන් ලාභයක් නොමැති අවස්ථාවල දී ලාභාංශ ප්‍රකාශ නොකරන අතර වැඩි ලාභයක් පවතින අවස්ථාවල ඉහළ ලාභාංශයක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

**සමාගමේ පවතින බලතල හිමිවීම.**
සමාගමක් කළමනාකරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසිනි. සාමාන්‍ය කොටස් හිමියන් අතරින් එම අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගැනේ. සාමාන්‍ය කොටස් හිමියන්ට අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමේ අවස්ථාව හිමිවේ.

**භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය**

රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රජය විසින් නිකුත් කරන බිල්පත් භාණ්ඩාගාර බිල්පත්ය. මේවා මිල දී ගැනීම කොටස් වෙළෙඳපල හරහා ද කළ හැකිය.

**භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන ප්‍රතිලාභ.**

- පොලියක් ලබාගත හැකිවීම
- පූර්ණ ආරක්ෂාවක් ලැබීම (අවධානම අඩුවීම)
- ඉක්මණින් මුදල් බවට පත්කළ හැකිවීම.

- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනු විශේෂයෙන් කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය සහ විධිමත් කිරීම සඳහා පිහිටා ඇති රජයේ ආයතනය යි.

- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වැදගත්කම
  - විධිමත් සහ සාධාරණ සුරැකුම්පත් වෙළෙඳපොළක් ශ්‍රී ලංකාවේ ඇති කිරීම.
  - කොටස් වෙළෙඳපොළ ආයෝජකයන් ආරක්ෂා කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- 11 ශ්‍රේණියේ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළපොතේ අදාළ පාඩම.

**තක්සේරුකරණය හා ඇගැයීම් නිර්ණායක**

- කොටස් වෙළෙඳපල ආයෝජනයේ වැදගත්කම පැහැදිලි කිරීම.
- කොටස් වෙළෙඳපල ආයෝජනය කළ හැකි විවිධ මාර්ග නම් කිරීම.
- විකල්ප ආයෝජන මාර්ග අතුරින් කොටස්වල ආයෝජනය කිරීමේ වැදගත්කම දැක්වීම.
- භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමේ වැදගත්කම පෙන්වා දීමට.